සැ. යු. -2009.06.12 දින පළ වූ අංක 1,606 දරන *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,607 - 2009 ජුනි මස 19 වැනි සිකුරාදා - 2009.06.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 802 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 802 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 805 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ජුනි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ජුනි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

D1286/DISC(AY).

### ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද සේවය අත්හිටුවීමක්

**සේවය අත්හිටුවීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2009 පෙබරවාරි මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ සේවය අර්ධ වැටුප් සහිතව අත්හිටුවීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරල් පරාක්‍රම පන්නිපිටිය, ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී (නි/50765)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 මාර්තු මස 04 වැනි දින,
කොළඹ දී ය.

06-304

2009 අංක 188

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික විං කමාණ්ඩර් නිලයට උසස් කෙරේ.

ස්කොඩ්රන් ලීඩර් ප්‍රියාල් චන්දන කමලහේවා (01913) - දන්ත - 2008.01.01
ස්කොඩ්රන් ලීඩර් නිලූකා දයානි බර්නදෙත් අබේසේකර (01876) - වෛද්‍ය - 2008.01.01
ස්කොඩ්රන් ලීඩර් කිරිහෙන්නදිගේ රෝහන ජයලත් (වී/0252) - වෛද්‍ය - 2008.01.02

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

06-383

2009 අංක 189

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

2008 මැයි මස 09 වැනි දින සිට පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට පෙර දක්වා ඇති නිලයන් යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරියට පත් කිරීමටත් එදිනම සිටම ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළ කොට ඇත.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් කෝනාර මුදියන්සේලාගේ හෙන්රි ජිනරත්න (02687) පාලන/පශු
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් උපුල් ප්‍රියන්ත සේතුංග (02688) පාලන/පශු
ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් විජේසිංහ ජයතිලකගේ නන්දන සුමනසිංහ (02689) පාලන/පශු
ෆ්ලයිං ඔෆිසර් විජේරත්න මුදියන්සේලාගේ දොන් නුවන් චාමර අන්ද්‍රාදි (02690) ගු. තො. නි.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

06-382

# රජයේ නිවේදන

අංකය ප්‍ර. නො. 11/2/35/02/2009/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2009.06.22 වැනි දින සිට 2009.07.05 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව, පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2009.07.12 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**උපලේඛනය**

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, "එම්" දරන කොට්ඨාසයේ 1056 වෙළුමේ 48 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ, ගල්කිස්ස ගම් සභා සීමාව තුළ පැපිලියාන යන ගමේ වරිපනම් අංක 33/5 දෙහිවල පාර පිහිටි අඹගහවත්ත නොහොත් ගොඩ කදුරුගහවත්ත නමැති ඉඩමට සී. එම්. තාජුදීන් බලයලත් මිනින්දෝරු තැන විසින් 1973.09.14 දින මැන සාදන ලද අංක 6/73 පිඹුරේ අ. 0, රූ. 0, පර්. 21.75 විශාල කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ කැබලි අංක 2 (අඩි 10 පළල පාර) නැගෙනහිරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් දකුණට : ඕ. සී. පෙරේරා අයිතිකම් කියන ඉඩම බස්නාහිරට : ඕ. ජේ. පෙරේරා අයිතිකම් කියන ඉඩම | 1. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.30 දින ලියා සහතික කළ අංක 741 දරන විකුණුම් ඔප්පුව<br>2. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.30 දින ලියා සහතික කළ අංක 742 දරන උකස් ඔප්පුව<br>3. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.04.23 දින ලියා සහතික කළ අංක 982 දරන තෑගි ඔප්පුව |
| -එම- එම් 1056 වෙළුමේ 278 පත් ඉරුව | - එම - | 1. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1982.11.19 දින ලියා සහතික කළ අංක 1310 දරන විකුණුම් ඔප්පුව<br>2. -එම- අංක 1311 දරන උකස් ඔප්පුව<br>3. පී. ඒ. සී. කේ. නියතපාල ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.08.30 දින ලියා සහතික කළ අංක 322 දරන උකස් ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ "එම්" දරන කොට්ඨාසයේ එම් 1056 වෙළුමේ 295 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ, ගල්කිස්ස ගම් සභා සීමාව තුළ පැපිලියාන යන ගමේ වරිපනම් අංක 33/5 දෙහිවල පාර පිහිටි අඹගහවත්ත නොහොත් ගොඩ කදුරුගහවත්ත නමැති ඉඩමට සී. එම්. තාජුදීන් බලයලත් මිනින්දෝරු තැන විසින් 1973.09.14 දින මැන සාදන ලද අංක 6/73 පිඹුරේ අ. 0, රූ. 0, පර්. 21.75 විශාල කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ කැබලි අංක 2 (අඩි 10 පළල පාර) නැගෙනහිරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් දකුණට : ඕ. සී. පෙරේරා අයිතිකම් කියන ඉඩම බස්නාහිරට : ඕ. ජේ. පෙරේරා අයිතිකම් කියන ඉඩම | 1. සී. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1986.02.03 දින ලියා සහතික කළ අංක 49 දරන උකස් ඔප්පුව<br>2. එස්. සමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1987.10.27 දින ලියා සහතික කරන ලද අංක 1305 දරන උකස් ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 2/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, "එම්" දරන කොට්ඨාසයේ 1056 වෙළුමේ 49 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ, ගල්කිස්ස ගම් සහා සීමාව තුළ පැපිලියාන යන ගමේ පිහිටි අඹගහවත්ත නොහොත් ගොඩ කදුරුගහවත්ත නමැති ඉඩමට සී. එම්. තාජුදීන් බලයලත් මිනින්දෝරු තැන විසින් 1973.09.14 දින මැන සාදන ලද අංක 6/73 පිඹුරේ අ. 0, රූ. 0, පර්. 2.50 විශාල කැබලි අංක 02 (මාර්ග අයිතිය) දරන බිම් කොටසට මායිම් :<br>උතුරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක්<br>නැගෙනහිරට : ඥානරතන මාවත<br>දකුණට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිවාසිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ කැබලි අංක 01<br>බස්නාහිරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් | 1. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.30 දින ලියා සහතික කළ අංක 741 දරන විකුණුම් ඔප්පුව<br>2. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1973.09.30 දින ලියා සහතික කළ අංක 742 දරන උකස් ඔප්පුව<br>3. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1978.04.23 දින ලියා සහතික කළ අංක 982 දරන තෑගි ඔප්පුව |
| -එම -<br>එම් 1056 වෙළුමේ 279 පත් ඉරුව | - එම - | 1. එල්. ඒ. පී. ද අල්විස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1982.11.19 දින ලියා සහතික කළ අංක 1310 දරන විකුණුම් ඔප්පුව<br>2. - එම - අංක 1311 දරන උකස් ඔප්පුව<br>3. පී. ඒ. සී. කේ. නියතපාල ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1984.08.30 දින ලියා සහතික කළ අංක 322 දරන උකස් ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, "එම්" දරන කොට්ඨාසයේ 1056 වෙළුමේ 296 පත් ඉරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ, ගල්කිස්ස ගම් සහා සීමාව තුළ පැපිලියාන යන ගමේ පිහිටි අඹගහවත්ත නොහොත් ගොඩ කදුරුගහවත්ත නමැති ඉඩමට සී. එම්. තාජුදීන් බලයලත් මිනින්දෝරු තැන විසින් 1973.09.14 දින මැන සාදන ලද අංක 6/73 පිඹුරේ අ. 0, රූ. 0, පර්. 2.50 විශාල කැබලි අංක 02 (මාර්ග අයිතිය) දරන බිම් කොටසට මායිම් :<br>උතුරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක්<br>නැගෙනහිරට : ඥානරතන මාවත<br>දකුණට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිවාසිකම් කියන මෙම ඉඩමේ කොටසක් සහ කැබලි අංක 01<br>බස්නාහිරට : එන්. ඒ. එෆ්. සිල්වා අයිතිකම් කියන මෙම ඉඩමේ කොටසක් | 1. සී. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1986.02.03 දින ලියා සහතික කළ අංක 49 දරන උකස් ඔප්පුව<br>2. එස්. සමරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1987.10.27 දින ලියා සහතික කරන ලද අංක 1305 දරන උකස් ඔප්පුව |

ඊ. එම්. ගුණසේකර,<br>
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,<br>
අංක 2/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,<br>
බත්තරමුල්ල.

06-293

මගේ අංකය ඃDS/MN/SS/Cul/04.

**වන්දනා ගමන් ආඥාපනත**

ශ්‍රී මාමාංග පිල්ලයාර් කෝවිල් වාර්ෂික උත්සවය - 2009

මඩකලපුව දිස්ත්‍රික්කය

යථොක්ත උත්සවය 2009 ජූලි මස 12 වැනි දින පටන් ගෙන 2009 ජූලි මස 21 වැනි දින දක්වා පවත්වනු ලබන බව මෙකී උත්සවයට වන්දනා සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1948.07.16 වැනි දින අංක 9886 දරන ආණ්ඩුවේ ගැසට් නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී එකී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ හා අනෙකුත් අයගේ අවධානය මෙයින් යොමු කරවමි.

කේ. පද්මරාජා මිය,
ප්‍රාදේශීය ලේකම්,
මන්මුනේ උතුර, මඩකලපුව.

2009 මැයි මස 22 වැනි දින,

06-299

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1803300212.

ණයකරුගේ සම්පූර්ණ නම : සියනායක මුදියන්සේලාගේ විජයානන්ද දිසානායක.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එන්. බී. ඒ. පී. බලල්ලේ හා එස්. ඩබ්. පී. එම්. ජී. පී. සේනානායක විසින් ලියා සහතික කරන ලද අංක 1095 හා 4087 හා 1995.11.25 හා 1997.09.11 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දාහතර දහස් පන්සිය අසූහතරයි ශත දහ නමයක (රු. 1,14,584.19) මුදලක් වර්ෂ 2004.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූහතර දහස් දෙසිය පනස් එකයි ශත හැට හතක (රු. 94,251.67) මුදල ද වර්ෂ 2004.01.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිදහස් තුන්සිය තිස්දෙකයි ශත පනස් දෙකක් (රු. 20,332.52) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දාහතර දහස් පන්සිය අසූහතරයි ශත දහ නමයක (රු. 1,14,584.19) මුදල ද,

(2) එකී රුපියල් අනූහතර දහස් දෙසිය පනස් එකයි ශත හැට හතක (රු. 94,251.67) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%බැගින් වන පොළියක් 2004.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ මාර්තු මස 30 වැනි දින පැවැති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ දී යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, නැගෙනහිර උඩුකහ කෝරළේ, මහරච්චි මුල්ල ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ නුගවෙල ගමෙහි පිහිටි සීනිඅඹගහමුල්ල වත්ත නමැති ඉඩමට 1993.01.31 දින ජී. එස්. ගොරකගහගොඩ මානක තැන විසින් මැන සම්පාදිත අංක 503ඒ පිඹුර ප්‍රකාර ලොට් 02ට මායිම්, උතුරට : ලොට් 01 ද, නැගෙනහිරට : ප්‍රධාන පාර ද - අලව්වේ සිට නාරම්මල දක්වා දිවෙන, දකුණට : එස්. එම්. පුංචිනිලමේගේ ඉඩම ද, බටහිරට : ඒ .එස්. සමරකෝන්ට අයත් ආඩියාදෙනිය වත්ත හෙවත් බෝගහ මුලවත්ත ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් දහසයයි දශම අටක (අ. 0, රූ. 3, පර්. 16.8) වපසරිකයින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද මාර්ග පරවශතාවය

ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 1041/204 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

සාමාන්‍යාධිකාරී.

06-415

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0200003569.

ණයකරුගේ සම්පූර්ණ නම : ධනපාල මුදියන්සේලාගේ සුසන්ත පුෂ්පකුමාර සහ රත්නායක මුදියන්සේලාගේ කිරිමුදියන්සේගේ අමරා ඉන්ද්‍රානි.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 747 හා 2006.11.24 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු 'බැංකුව' යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ අනූහය දහස් දෙසිය හතලිස් නවයයි ශත තිස්තුන (රු. 5,96,249.33) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූ හතරදහස් හත්සිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ නවයක (රු. 4,94,772.79) මුදල ද වර්ෂ 2008.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ එක් දහස් හාරසිය හැත්තෑහයයි ශත පනස් හතරක් (රු. 1,01,476.54) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ අනූහය දහස් දෙසිය හතලිස් නවයයි ශත තිස්තුන (රු. 5,96,249.33) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ අනූහතර දහස් හත්සිය හැත්තෑ දෙකයි ශත හැත්තෑ නවයක (රු. 4,94,772.79) මුදල මත අයවිය යුතු වර්ෂයකට 19.90%ක් බැගින් වන පොලියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබොඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවේ, මැදවල ග්‍රාමයේ හි පිහිටි මිදිගහවත්ත නමැති ඉඩමට 2006.05.20 දින ඒ. ඒ. පී. ඒ. රංජිත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 962 පිඹුර ප්‍රකාර ලොට් 06ට මායිම්, උතුරට : ලොට් 01 හා 05 ද, නැගෙනහිරට : ලොට් 05 සහ පාර (සංවර්ධන සභාව) සහ පිඹුරු අංක 1169/P හි ලොට් H. I. J. ද, දකුණට : පිඹුරු අංක 1169/P හි ලොට් 11 සහ පාර (සංවර්ධන සභාව) ද, බටහිරට : පිඹුරු අංක 1169/P හි ලොට් D ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහක (අ. 0, රූ. 1, පර්. 2.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 409/03 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි.

සාමාන්‍යාධිකාරී.

06-414

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0200003138.

ණයකරුගේ සම්පූර්ණ නම : මඩපාත කංකානම්ලාගේ කරුණාදාස.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්. විජේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 418 හා 2006.01.24 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පනහයි ශත හැත්තෑහයක (රු. 1,72,750.76) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පනස් දහස් නවසිය හයයි ශත අසූ නවයක

(රු. 1,50,906.89) මුදල ද වර්ෂ 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් විසිඑක් දහස් අටසිය හතලිස් තුනයි ශත අසූ හතක් (රු. 21,843.87) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ හැත්තෑ දෙදහස් හත්සිය පනහයි ශත හැත්තෑහයක (රු. 1,72,750.76) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පනස් දහස් නවසිය හයයි ශත අසූ නවයක (රු. 1,50,906.89) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17%බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009ක් වූ ජනවාරි මස 27 වැනි දින යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, දොම්පෙ ප්‍රාදේශීය සභා සීමාවේ කඳාන හෝ කඳානෙගොඩ ග්‍රාමයෙහි පිහිටි හොරගහලන්ද නොහොත් මහපොල්කොටුව හෝ බෝගහවත්ත නැමති ඉඩමට 2001.02.13 දින ඩී. ඒ. විජේසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක W/2879 පිඹුර ප්‍රකාර ලොට් 2ට මායිම්, උතුරට : පිඹුරු අංක $131/A^3$ හි ලොට් $A3^9$ ද, නැගෙනහිරට : පිඹුරු අංක $131/A^3$ හි ලොට් $A3^4$ ද, දකුණට : පිඹුරු අංක $131/A^3$ හි ලොට් $2^x$ (පාර) ද, බටහිරට : ලොට් 1 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම හයක (අ. 0, රූ. 0, පර්. 9.6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ගවශතාවය සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 312/241හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

06-413

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේපාල දීගොඩ ගමගේ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 5132 සහ 2006 නොවැම්බර් මස 03 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් (මෙහි මින් මතු උකස්කරුවන් වශයෙන් හඳුන්වනු ලබන) කඩුවෙල, පහළ බෝමිරිය, හප්පාවල පාරේ අංක 56/5/J දරන ස්ථානයේ පදිංචි හෙවන්මැද රත්කොත්ගේ මෛත්‍රී ජයසේකර සහ හෙවන්මැද රත්කොත්ගේ පියසිරි සේනාරත්න යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද ඉහත සඳහන් උකස්කරුවන් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව 2008.08.13 දිනට රුපියල් නවලක්ෂ දහනවදහස් එකසිය අසූඅටකුත් ශත පනස්තුනක මුදලක් (රු. 9,19,188.53) වර්තමානයේ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින් බැවින් ද, ඉහත කී රුපියල් නවලක්ෂ දහනවදහස් එකසිය අසූඅටකුත් ශත පනස්තුනක මුදල (රු. 9,19,188.53) සහ නිවාස ණය මත හිඟ මුදල වශයෙන් රුපියල් අටලක්ෂ හැත්තෑතුන්දහස් නවසිය හැටඑකකුත් ශත දෙකක මුදල මත (රු. 8,73,961.02) 2008.08.14 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19.80% බැගින් තවදුරටත් පොලිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියැඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත උඩුපිල ගමේ පිහිටි මිල්ලගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් මැන සාදන ලද අංක 1677 සහ 2003 ජූලි මස 25 වැනි දිනැති පිඹුරු ප්‍රකාර බෙදා වෙන් කළ (මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩමේ අනුබෙදීමක් වන( ලොට් 22 නමැති බිම් කොටසට මායිම්, උතුරට : ඩී. සී. රණතුංග සහ වෙනත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ලොට් 23 ද, දකුණට : ලොට් 13 ද, බස්නාහිරට : ලොට් 21 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1677 දරන පිඹුර අනුව පර්චස් දොළහකුත් දශම පහයි බින්දුවක (අ. 0, රූ. 0, පර්. 12.50) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු සහ සෑම සියලු දේත් සමග ය.

ඉහත කී ලොට් 22 පහත විස්තර කරන ඉඩමේ අනුබෙදීමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ (නාරන්වල උප කාර්යාලයේ) උඩුපිල ගමේ පිහිටි මිල්ලගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් මැන සාදන ලද අංක 1611 සහ 2003 ජුනි මස 18 වැනි දිනැති පිඹුර ප්‍රකාර (බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් මැන සාදන ලද අංක 7278 සහ

1996 සැප්තැම්බර් මස 17 වැනි දිනැති පිඹුර ප්‍රකාර ලොට් 1A, 1B සහ 1C ඒකාබද්ධ කිරීමක් වන) ලොට් 1 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : (ප්‍රාදේශීය සභා) පාර සහ ඩී. සී. රණතුංග සහ වෙනත් අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : පිට ඇල ද, දකුණට : ඩබ්ලිව්. ඒ. සේදිරිස් පෙරේරා, කේ. පී. ඕදියස් සිංඤ්ඤෝ සහ තවත් අය අයිතිවාසිකම් කියන ඉඩම ද, (ප්‍රාදේශීය සභා) පාර ද, (අඩි 12ක් පළල) පාර ද, බස්නාහිරට : ලොට් 2 (අඩි 12ක් පළල පාර) සහ (ප්‍රාදේශීය සභා) පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1611 දරන පිඹුර අනුව අක්කර පහයි පර්චස් විසිහතරකුත් දශම බිංදුවයි දෙකක (අ. 5, රූ. 0, පර්. 24.02) විශාල බිම් කොටස සහ ඊට අයත් ගහකොළ, පළතුරු සහ සෑම සියලු දේත් සමගය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C659/6 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට පහත සඳහන් ඉඩම්වලින් මාර්ග අයිතිය එනම්, බඩු පටවාගෙන හෝ පටවා නොගෙන පයින් ගමන් කිරීම වාහනවලින් ගමන් කිරීම සහ විදුලි කණු සිටුවීම, විදුලි රැහැන් ඇදීම, දුරකථන රැහැන් ඇදීම, ජලනල සහ ජලාපවහන නළ එළීම ආදී සියලු කටයුතු සඳහා යොදා ගැනීමේ අයිතිය ද සමග ය.

ඉහත කී උඩුපිල ගමේ පිහිටි මිල්ලගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එච්. පී. කෝට්ටෙගොඩ විසින් මැන සාදන ලද අංක G 904 සහ 1979 අගෝස්තු මස 10 වැනි දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 2 (අඩි 12ක් පළල පාර සඳහා වෙන් කිරීම) නමැති ඉඩමට මායිම්, උතුරට : කරත්ත පාර ද, නැගෙනහිරට : කලින් කොර්නේලිස් ගෝමස් ද, වර්තමානයේ දී ඩබ්ලිව්. ඒ. සේදිරිස් පෙරේරා, කේ. පී. ඕදියස් සිංඤෝ සහ තවත් අය අයිතිවාසිකම් කියන ඉඩම සහ ලොට් 01 ද, දකුණට : ලොට් 3 සහ 4 ද, බස්නාහිරට : ලොට් 5 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක G 904 දරන පිඹුර අනුව පර්චස් විසිදෙකක් (අ. 0, රූ. 0, පර්. 22) විශාල බිම් කැබැල්ල ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 429/77 දරන වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

මෑතකාලීනව සිදු කළ මැනීමට අනුව ඉහත කී ලොට් 2 සවිස්තරාත්මකව පහත දැක්වේ :

ඉහත කී උඩුපිල ගමේ පිහිටි මිල්ලගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ජී. රණසිංහ විසින් මැන සාදන ලද අංක 1611 සහ 2003 ජූනි මස 18 වැනි දිනැති පිඹුර ප්‍රකාර (බලයලත් මිනින්දෝරු එස්. එච්. පී. කෝට්ටෙගොඩ විසින් මැන සාදන ලද අංක G 904 හා 1979 අගෝස්තු මස 10 දිනැති පිඹුර ප්‍රකාර ලොට් 2හි නැවත මැනීමක් වන) ලොට් 2 නමැති බෙදා වෙන් කළ බිම් කොටසට (අඩි 12ක් පළල පාර සඳහා වෙන් කිරීම) මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර සහ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 1 සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : අංක G 904 දරන පිඹුරේ ලොට් 3 සහ 4 ද, බස්නාහිරට : අංක G 904 දරන පිඹුරේ ලොට් 5 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1611 දරන පිඹුර අනුව පර්චස් විස්සයි දශම හතයි තුනක (අ. 0, රූ. 0. පර්. 20.73) විශාල ඉඩම සහ අංක 1677 දරන ඉහත කී පිඹුරේ ලොට් 52, 53, 59 ලෙස ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 429/77 දරන වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඊට ඉහත අංක 1677 දරන පිඹුරේ ලොට් 52, 13, 53 සහ 59 වශයෙන් ලකුණු කරන ලද පාර සඳහා වෙන් කිරීම් මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.

06-436/3

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 මාර්තු මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චතුරි ප්‍රියදර්ශිකා රුලිගු රණසිංහ විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 4027 සහ 2004 සැප්තැම්බර් මස 24 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් (මෙහි මින් මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කුලියාපිටිය, පහලපිදුම, "හෙට්ටිවත්ත" පදිංචි පලිහවඩන ආරච්චිගේ ඔස්වල්ඩ් පෙරේරා හෙවත් පලිහවඩන ආරච්චිගේ ඔස්වල්ඩ් පෙරේරා විජේගුණවර්ධන හෙවත් අසංක යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලබන) කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව 2007.08.06 දිනට රුපියල් හත්ලක්ෂ හැත්තෑදහස් නවසිය හැටහයකුත් ශත තිහක මුදලක් (රු. 7,70,966.30) වර්තමානයේ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් හත්ලක්ෂ හැත්තෑ දහස් නවසිය හැටහයකුත් ශත තිහක මුදල (රු. 7,70,966.30) සහ 2007.08.06 දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වන රුපියල් හයලක්ෂ පනස්හතරදහස් එකසියහැටකුත් ශත පහළොවක මුදල මත (රු. 6,54,160.15) 2007.08.07 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 20% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියැඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දකුණ යටිකහ කෝරළේ, කටුගම්පොල, හත්පත්තුවේ, පිදුම ගමේ පිහිටි "හෙට්ටිවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. බී. නවරත්න විසින් මැන සාදන ලද අංක 4217 සහ 2001 ජූනි මස 11 දිනැති පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කළ ලොට් 3 දරන බිම් කොටසට මායිම්, උතුරට : 1948 FVP හි ලොට් 345 වර්තමානයේ දී එච්. ඒ. රූපසිංහගේ ඉඩම ද, අංක 4217 දරන පිඹුරේ ලොට් 4 ද, නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර ද, දකුණට : අංක 4217 දරන

පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට ඃ අංක 4217 දරන පිඹුරේ ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 4217 දරන පිඹුර අනුව පර්චස් තිස්තුනකුත් දශම අටයි හතරක (අ. 0, රූ. 0, පර්. 33.84) විශාල බිම් කොටස සහ ඊට අයත් ගොඩනැගිලි, පස්, ගහකොළ, පළතුරු සහ සෑම සියලු දේත් සමග ය. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J129/07 දරන හිමිකම් වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06-436/1

---

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2007.11.23 දිනැති අංක 13017 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හරිස්චන්ද්‍ර සමරසිංහ ගුණවර්ධන යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හතලිස් හතර දහස් එකසිය හැට හයයි ශත හැටහත (රු. 3,44,166.67) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2000.01.15 වැනි දින සිට වර්ෂයකට 27% බැගින් රුපියල් තුන්ලක්ෂ හතලිස් හතර දහස් එකසිය හැට හයයි ශත හැටහත (රු. 3,44,166.67) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන් ලක්ෂ හතලිස් හතර දහස් එකසිය හැටහයයි ශත හැට හත (රු. 3,44,166.67) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 13017 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, මඩුවෙගෙදර ග්‍රාමයේ පිහිටි රන්පොකුණවත්ත නොහොත් පොකුණවෙලේවත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. ඩී. ෆීලික්ස් ආර්. පෙරේරා විසින් 1983.11.30 වැනි දින මැන බෙදා වෙන් කරන ලද (ටී. විශ්වකුමාර මිනින්දෝරුතැන සහතික කරන ලද අංක ගම් 147 දරන පිඹුරේ ලොට් අංක 606 දරන කොටසට මායිම්, උතුරට ඃ ලොට් 634 සහ 635 ද, නැගෙනහිරට ඃ ලොට් 605 ද, දකුණට ඃ ලොට් 602 ද, බස්නාහිරට ඃ ලොට් 607 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම හතරයි හතර (අ. 0, රූ. 0, පර්. 5.44) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්. 263/239හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී පිඹුරේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-363

---

## මහජන බැංකුව - මීනුවන්ගොඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජිත ඒ ද සිල්වා විසින් සහතික කරන ලද 2007.01.11 දිනැති අංක 4068 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රේවත සෙනරත් බණ්ඩාර රත්නායක යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහනව ලක්ෂ තිස් එක්දහස් හාරසිය පනස් පහයි ශත පනස් හතක (රු. 19,31,455.57) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.12.10 වැනි දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් දහනව ලක්ෂ තිස්එක්දහස් හාරසිය පනස් පහයි ශත පනස් හතක (රු. 19,31,455.57) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහනව ලක්ෂ තිස් එක්දහස් හාරසිය පනස් පහයි ශත පනස් හතක (රු. 19,31,455.57) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4068 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසිය පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල සීමාවේ මැඩැමුල්ල නමැති ගමේ දිවුලපිටිය පාරේ, වරිපනම් අංක 180/7E දරන ස්ථානයේ පිහිටි බෙලිගහවත්ත නොහොත් බුළුගහවත්ත සහ බුළුගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතා විසින්

1994.06.18 වැනි දින මැන සකස් කරන ලද පිඹුරු අංක A57/94 දරන පිඹුරේ ලොට් අංක 11 දරන ඉඩමට මායිම්, උතුරට : ලොට් 13 ද, නැගෙනහිරට : ලොට් අංක 10 ද, දකුණට : කේ. කේ. පුංචි බණ්ඩාට අයිති ඉඩම ද, බස්නාහිරට : මැගිලින්ට අයත් ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 13.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක C780/271 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී පිඹුරේ පාරවල් සඳහා වෙන්කළ කොටස්වල මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

06-362

---

## සෙලාන් බැංකුව පී.එල්.සී. - fපස්ට් සිටි ඔfපිස් ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.04 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රගී සිවදාසන් විසින් සහතික කරන ලද 2008 පෙබරවාරි මස 08 වැනි දිනැති අංක 625 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 1, ලියාපදිංචි අංක 14352 දරන ජෙනරල් ට්‍රේඩර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොළඹ 10, මොහමඩ් කාසිම් හලීම් යනුවෙන් ද හඳුන්වනු ලබන මොහමඩ් කාසිම් මොහමඩ් හලීම් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පන්කෝටි හැටහතරලක්ෂ විසිනවදහසයි ශත අසූවක (රු. 5,64,29,000.80) මුදලක් 2008 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 5,64,29,000.80 මුදල ද, 2009 ජනවාරි මස 01 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 625 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ අළුත් යොන් වීදියේ පිහිටි දැන් වරිපනම් අංක 61 දරන සහ වෝර්ඩ් අංක 4හි කලින් වරිපනම් අංක 18ඒ දරන ගොඩනැගිල්ල සමග ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 42 දරන පරිශ්‍රය ද, ඊසාණට : පත්තු මුතුට අයිති ලොට් බී ද, ගිණිකොණට : අළුත් යොන් වීදිය සහ නිරිතට : වරිපනම් අංක 17 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු චාල්ස් ඒ. බයිසර් විසින් සාදන ලද 1906 ජූලි මස 28 දිනැති සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 9.47) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත් ඉරුව ඒ 856/250 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාව තුළ වෝර්ඩ් 19 දැන් දකුණු කොච්චිකඩේ තුළ ශාන්ත පාවුළු වෝඩ් හි අළුත් යොන් වීදිය දිගේ පිහිටි දැන් මහ නගර සභා වරිපනම් අංක 59 (කලින් වරිපනම් අංක 17, මුලින් පරිපනම් අංක 26 දරන) දරන ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිල්ල සමග පරිශ්‍රයට මායිම්, උතුරට : සින්න මරියාගේ දේපළ, දැන් පීනා කච්චි මොහම්මදුගේ පරිශ්‍රය ද, නැගෙනහිරට : සලීමා ලෙබ්බේ ගේ නිවස සහ බිම ද, දකුණට : අළුත් යොන් වීදිය සහ බස්නාහිරට : ඔඩාමා ලෙබ්බේගේ නිවස සහ බිම යන මායිම් තුළ පර්චස් දහහතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 17.48) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත් ඉරුව ඒ 814/228 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු සී. එච්. ජේ. ලෙන්බාගන් විසින් සාදන ලද 1895 මාර්තු මස 30 දිනැති අංක 251 දරන සැලැස්ම අනුව මායිම්, උතුරට : පී. කච්චි මොහම්මදුට අයිති ඉඩම ද, නැගෙනහිරට : අංක 18 දරන නිවස, සින්න ලෙබ්බේ මරික්කාර් හජ්ජියාර්ගේ දේපළ ද, දකුණට : අළුත් යොන් වීදිය සහ බස්නාහිරට : අංක 16 දරන නිවස, මොහම්මදු ලෙබ්බේ මරික්කාර්ගේ දේපළ ද යන මායිම් තුළ පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0. පර්. 17.48) විශාල ඉඩම.

එකී ඉඩම සහ පරිශ්‍රය බලයලත් මිනින්දෝරු කේ. නඩරාජා විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 23 සහ 24 දිනැති අංක 1705 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාව තුළ වෝර්ඩ් 19 දකුණු කොච්චිකඩේ අළුත් වීදිය දිගේ පිහිටි අළුත් යොන් වීදිය වරිපනම් අංක 59 දරන ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග අංක 1705 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන (දැන් අළුත් යොන් වීදිය වරිපනම් අංක 59 දරන කලින් වරිපනම් අංක 17 දරන පරිශ්‍රයෙහි නැවත මැනීමක් වන) ලොට් එක්ස් ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : මැද පාර වරිපනම් අංක 35, 36 සහ 37 ද, නැගෙනහිරට : අළුත් යොන් වීදිය වරිපනම් අංක 61 දරන පරිශ්‍රය ද, දකුණට : අළුත් යොන් වීදිය සහ බස්නාහිරට : ගිණි විවරය ද යන මායිම් තුළ එකී අංක

1705 දරන සැලැස්ම අනුව පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 17.48) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-330/2

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - ෆස්ට් සිටි ඔෆිස් ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.04 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. ඕ. ද ලිවේරා විසින් සහතික කරන ලද 1990 සැප්තැම්බර් 10 වැනි දිනැති අංක 245, ප්‍රසිද්ධ නොතාරිස් කේ. ජී. චන්ද්‍රසිරි විසින් සහතික කරන ලද 1996 දෙසැම්බර් 6 දිනැති අංක 188, ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් දෙකම සහතික කරන ලද 2003 නොවැම්බර් මස 11 දිනැති අංක 866 සහ 867 දරන බැඳුම්කර සහ 2003 නොවැම්බර් මස 12 දිනැති අංක ආර්සීවී/2003/001 දරන තොග උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 01හි ලියාපදිංචි අංක 143352 දරන ජෙනරල් ට්‍රේඩර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ තනි ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන කොළඹ 10, මොහමඩ් කාසිම් හලීම් යනුවෙන් ද හඳුන්වනු ලබන මොහමඩ් කාසිම් මොහමඩ් හලීම් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දොළොස් කෝටි පනස් හයලක්ෂ දහනවදහස් පන්සිය හැටතුනයි ශත තිස් දෙකක (රු. 12,56,19,563.32) මුදලක් 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. රු. 12,56,19,563.32 මුදල ද, 2008 පෙබරවාරි මස 01 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 245, 188, 866, 867 දරන බැඳුම්කර සහ ආර්සීවී/2003/001 දරන තොග උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ 3 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන යන්ත්‍ර සූත්‍ර බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමුවැනි උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ අලුත් යොන් වීදියේ පිහිටි දැන් වරිපනම් අංක 61 දරන සහ වෝර්ඩ් අංක 4හි කලින් වරිපනම් අංක 18ඒ දරන එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩම් කොටසට මායිම්, උතුරට : වරිපනම් අංක 42 දරන පරිශ්‍රය ද, ඊසාණට : පත්තු මුතුට අයිති ලොට් බී ද, ගිණිකොණට : අලුත් යොන් වීදිය සහ නිරිතට : වරිපනම් අංක 17 දරන පරිශ්‍රය ද යන මායිම් තුළ බලයලත් මිනින්දෝරු චාල්ස් ඒ. බයිසර් විසින් සාදන ලද 1906 ජූලි මස 28 වැනි දිනැති සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 9.47) විශාල ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඒ 856/250 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රිකයේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ වෝර්ඩ් 19 දැන් දකුණු කොච්චිකඩේ තුළ ශාන්ත පාවුළුගේ වෝඩ්හි අලුත් යොන් වීදිය දිගේ පිහිටි දැන් මහනගර සභා වරිපනම් අංක 59 (කලින් වරිපනම් අංක 17, මුලින් වරිපනම් අංක 26 දරන) දරන ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිල්ල සමග පරිශ්‍රයට මායිම්, උතුරට : සින්න මරියාගේ දේපළ, දැන් පීනා කච්චි මොහම්මදුගේ දේපළ ද, නැගෙනහිරට : සීලීමා ලෙබ්බෙගේ නිවස සහ බිම ද, දකුණට : අලුත් යොන් වීදිය සහ බස්නාහිරට : ඕඩාමා ලෙබ්බෙගේ නිවස සහ බිම යන මායිම් තුළ පර්චස් දහහතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 17.48) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව ඒ 814/228 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු සී. එච්. ජේ. ලෙන්බාගන් විසින් සාදන ලද 1895 මාර්තු මස 30 දිනැති අංක 251 දරන සැලැස්ම අනුව මායිම්, උතුරට : පී. කච්චි මොහම්මදුට අයිති ඉඩම ද, නැගෙනහිරට : අංක 18 දරන නිවස, සින්න ලෙබ්බේ මරික්කාර් හජ්ජියාර්ගේ දේපළ ද, දකුණට : අලුත් යොන් වීදිය සහ බස්නාහිරට : අංක 16 දරන නිවස, මොහම්මදු ලෙබ්බේ මරික්කාර්ගේ දේපළ ද යන මායිම් තුළ පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ 0, රූ. 0, පර්. 17.48) විශාල ඉඩම.

එකී ඉඩම සහ පරිශ්‍රය බලයලත් මිනින්දෝරු කේ. නඩාරාජා විසින් සාදන ලද 1992 පෙබරවාරි මස 23 සහ 24 දිනැති අංක 1705 දරන සැලැස්ම අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාව තුළ වෝර්ඩ් 19 දකුණු කොච්චිකඩේ අලුත් වීදිය දිගේ පිහිටි අලුත් යොන් වීදිය වරිපනම් අංක 59 දරන ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග අංක 1705 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන (දැන් අලුත් යොන් වීදිය වරිපනම් අංක 59 දරන කලින් වරිපනම් අංක 17 දරන පරිශ්‍රයෙහි නැවත මැනීමක් වන) ලොට් එක්ස් ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : මැද පාර වරිපනම් අංක 35, 36, 37 ද, නැගෙනහිරට : අලුත් යොන් වීදිය වරිපනම් අංක 61 දරන පරිශ්‍රය ද, දකුණට : අලුත් යොන් වීදිය සහ බස්නාහිරට : ගිණි විවරය ද යන මායිම් තුළ එකී අංක 1705 දරන සැලැස්ම අනුව පර්චස් දහ හතයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 17.48) විශාල ඉඩම.

**දෙවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කිරුළපන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කුප්පියාවත්ත වෝඩ් හි ශ්‍රී වජිරශ්‍රාම මාවත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී, පී. සේනාධීර විසින් සාදන ලද 1973 සැප්තැම්බර් මස 14 දිනැති සභාධිපත්‍ය සැලසුම් අංක 677හි පෙන්නුම් කරනු ලබන වජිරශ්‍රාම

මාවත මහල් නිවාසයේ 3 වැනි තට්ටුවේ වරිපනම් අංක 10/3/2 දරන පරිශ්‍රයට මායිම්, උතුරට : අංක 10/3/2 තට්ටු නිවාසයේ උතුරු බිත්තිය සහ අංක 10/3/2 තට්ටු නිවාසයේ නැගෙනහිර සදළු තලයේ උතුරු බිත්තිය ද, නැගෙනහිරට : අංක 10/3/2 තට්ටු නිවාසයේ නැගෙනහිර සදළු තලයේ නැගෙනහිර බිත්තිය ද, දකුණට : අංක 10/3/2 තට්ටු නිවාසයේ නැගෙනහිර සදළු තලයේ දකුණු බිත්තිය අංක 10/3/2 තට්ටු නිවාසයේ දකුණු බිත්තිය සහ අංක 10/3/2 තට්ටු නිවාසයේ දකුණු සදළු තලය සහ වයි ලකුණු කළ තරප්පු පෙලේ උතුරු බිත්තිය සහ බස්නාහිරට : අංක 10/3/2 තට්ටු නිවාසයේ බස්නාහිර බිත්තිය සහ වයි ලකුණු කළ තරප්පු පෙලේ නැගෙනහිර බිත්තිය ද, උඩින් අංක 10/3/2 තට්ටු නිවාසයේ 3 වැනි තට්ටුවේ සමතලා වහල සහ පහත අංක 10/3/2 තට්ටු නිවාසයේ 3 වැනි තට්ටුවේ බිම ද යන මායිම් තුළ අංක 677 දරන සැලැස්ම අනුව වර්ග අඩි එක් දහස් තුන්සිය හතලිහක (වර්ග අඩි 1340) ප්‍රමාණයෙන් යුත් තට්ටු නිවාසය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කොන්ඩමෝනියම් ඒ4/66හි ලියාපදිංචි කර ඇත.

*පහත සඳහන් දෑ ඇතුළුව :*

1. එකී අංක 677 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ ලෙස පෙන්නුම් කරනු ලබන පර්චස් දහනවයයි දශම අටයි හයක් (අ. 0, රූ. 0, පර්. 19.86) යුත් ඉඩම.

2. එකී අංක 677 දරන සැලැස්මේ විස්තර කරනු ලබන තට්ටු නිවාසයෙන් ආවරණය වන කොටස් හැර ගොඩනැගිල්ලේ සියලු ඉදිකිරීම්.

3. එකී අංක 677 දරන සැලැස්මේ විස්තර කරනු ලබන පරිශ්‍රයේ ඊසාණ දිගින් පිහිටි පොම්පය සහ පොළොව යට ටැංකිය.

4. වයි ලකුණු කළ තරප්පු පෙළ.

5. තුන්වැනි මහලට උඩින් පිහිටි ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් සමතලා වහළ.

*උපාංග ඒකක :*

එකී අංක 677 දරන සැලැස්මේ එක්ස් ලකුණු කළ පළමුවැනි, දෙවැනි සහ තුන්වැනි මහල් නිවාසවලට පොදු සේවක නාන කාමරය සහ වැසිකිලිය.

**ඉහත සඳහන් 3 වැනි උපලේඛනය**

පහත සඳහන් ද්‍රව්‍යවලින් සමන්විත එක්ව සහ වෙන් වෙන්ව ඇති වෙළඳ බඩු තොග, නිමි සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ සියලු වෙනත් ද්‍රව්‍ය :

| *අයිතම* | *ප්‍රමාණය* |
|---|---|
| ඉලෙක්ට්‍රොනික් ද්‍රව්‍ය | |
| ඒඑච් 21 සෝනි රූපවාහිනී යන්ත්‍ර | 50 |
| එස්ජ් 41 ඕගන් | 3 |
| එස්ජ් 21 ඕගන් | 1 |
| එම් 50 ගුවන්විදුලි යන්ත්‍ර | 2 |
| fපුගිටල් වීසීඩී | 37 |
| රෙදි සෝදන යන්ත්‍ර | 1 |
| 21එස්15 පැනසොනික් රූපවාහිනී යන්ත්‍ර | 1 |
| වායුසමන 2400 (Air Condition) | 1 |
| සෝනි රූපවාහිනී යන්ත්‍රය 29" | 1 |
| හෝම් තියටර් සිස්ටම් සෝනි | 1 |
| සිවිලිම් විදුලි පංකා | 4 |
| 993 ටීවී ඇන්ටනා | 1 |
| සෝනි පීජී 21 රූපවාහිනී යන්ත්‍ර | 25 |
| ඩීවීඩී 366 | 2 |
| වීසීආර් | 2 |
| *විදුලි ජනක යන්ත්‍ර :* | |
| 1.5 කේවී | 35 |
| 2.0 කේවී | 23 |
| 2.5 කේවී | 13 |
| 3.0 කේවී | 9 |
| Bx 6504 | 4 |
| Bx 550 | 1 |

මාබල්

*බීඩි කොළ :*

| | |
|---|---|
| 100 බණ්ඩල සාමාන්‍යයෙන් | 6000 කිග්‍රෑ |
| 167 බණ්ඩල | 10020 කිග්‍රෑ. |
| 200 බණ්ඩල | 12000කිග්‍රෑ. |

*බීඩි දුම්කොළ :*

| | |
|---|---|
| 17 බණ්ඩල | 578 කිග්‍රෑ. |
| 526 බණ්ඩල | 17884 කිග්‍රෑ |
| 285 බණ්ඩල | 9690 කිග්‍රෑ. |
| 142 බණ්ඩල | 4828 කිග්‍රෑ. |

*වාහන :*

| | |
|---|---|
| එෆ්බී නිසාන් සනී | 1 යුනිට් |
| එන් 16 නිසාන් සනී | 3 යුනිට් |

අංක 59/7, නව යොන් වීදිය, කොළඹ 12හි සහ අංක 10, ශ්‍රී වජිරශ්‍රම මාවත, කොළඹ 10හි තැන්පත් කර ඇත.

I

සහ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය තුළ කොළඹ 12, නව යොන් වීදිය, වරිපනම් අංක 59/7 දරන පරිශ්‍රයෙහි බහා ඇති සියලු වෙනත් ද්‍රව්‍ය සහ සියලු සහ තනි ලී බඩු, සවිකිරීම් සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම විස්තරයක අනිකුත් චංචල දේපළ සහ (ඒ සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින් මතු බන්ධනදායීට හිමි වෙළඳ බඩු තොග, ද්‍රව්‍ය නිමි සහ නොනිමි භාණ්ඩ යනුවෙන් හඳුන්වනු ලබන) සහ බන්ධනදායී විසින් දැන් හෝ කවර කලක හෝ මින්මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය ගෙන යනු ලබන්නාවූ ස්ථානවල ඇති සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ කලින් කලට සහ මින් මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා කාලයන්හි වෙළඳ බඩු තොග ද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම විස්තරයක වෙනත් චංචල දේපළ රැගෙන යනු ලබන හෝ බහා තබනු ලබන හෝ බන්ධනදායී විසින් මින්මතු ඕනෑම වෙලාවක සහ කලින් කලට වෙළඳ බඩු තොග ද්‍රව්‍ය නිමි සහ නොනිමි භාණ්ඩ සහ ද්‍රව්‍ය සහ වෙනත් චංචල දේපළ ගෙන ගොස් ව්‍යාපාර හෝ වෙළඳාම හෝ ගුදම් කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක් හෝ ස්ථානයන්.

II

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ රේගුවේ සහ ගුදම්වල බහා ඇති (මෙහි මින්මතු

බන්ධනදායීට හිමි වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ) සියලු සහ තනි ද්‍රව්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම මාදිලියකම සියලු වෙනත් භාණ්ඩ මෙම සෑම ද්‍රව්‍යයක්ම.

III

බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, කටුනායක ගුවන් තොටුපලේ ගුදම්වල සහ ගබඩාවල බහා ඇති (මෙහි මින්මතු බන්ධනදායීට හිමි ගුවන් තොටුපොළ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ). සියලු සහ තනි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම මාදිලියකම සියලු වෙනත් භාණ්ඩ මෙම සෑම ද්‍රව්‍යයක්ම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-330/3

---

**සෙලාන් බැංකුව පී.එල්.සී. - හෝමාගම ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0430-01353426-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.01.27 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2004 ඔක්තෝබර් 01 වැනි දිනැති අංක 3225 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දැඩිගමුව පදිංචි ඉන්දික ප්‍රසන්න කුමාර කෝරළගේ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හත්ලක්ෂ හතලිස් අටදහස් දෙසිය දොළහයි ශත හැට දෙකක (රු. 7,48,212.62) මුදලක් 2008 ජනවාරි මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 7,48,212.62 මුදල ද, 2008 පෙබරවාරි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3225 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ පනාගොඩ පිහිටි බලයලත් මිනන්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සාදන ලද 1998 අප්‍රේල් මස 22 දිනැති අංක 1393 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කීණගහ එස්ටේට් නමැති ගොඩනැගිලි, ගස් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සාදන ලද 1990 සැප්තැම්බර් මස 26 දිනැති අංක 311 දරන සැලැස්මේ සඳහන් ලොට්ස් 5 සහ 6 හි එකතු කිරීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 4 ද, නැගෙනහිරට : ලොට් 8 (අඩි 5ක් පළල වෙන් කිරීම-පවත්නා පාර පළල් කිරීම සඳහා) ද, දකුණට : ලොට් 7 සහ බස්නාහිරට : කෝරළගේ හරමානිස් අප්පු සහ තවත් අයගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 1393 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම.

පහත විස්තර කරනු ලබන පාර සඳහා වෙන් කිරීම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග

1. පෙර කී පනාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සාදන ලද 1989 ජනවාරි 15 දිනැති අංක 150 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කීණගහ එස්ටේට් නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : පේරගස්හේන ද, දකුණට : කීණගහවත්ත පේගස්හේන සහ ලොට්ස් 2ඒ සහ 2බී සහ බස්නාහිරට : කීණගහවත්ත යන මායිම් තුළ එකී අංක 150 දරන සැලැස්ම අනුව පර්චස් තිස් අටයි දශම හයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 38.63) විශාල ඉඩම

2. පෙර කී පනාගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සාදන ලද 1990 සැප්තැම්බර් මස 26 දිනැති අංක 311 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කීණගහ එස්ටේට් නමැති ඉඩමේ ලොට් 8 ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. ඒ. සුගතපාල විසින් සාදන ලද අංක 150 දරන සැලැස්මේ සඳහන් ලොට් 4 ද, දකුණට : කීණගහවත්තේ ඉතිරි කොටස, බස්නාහිරට : කෝරළේ හරමානිස් අප්පු සහ තවත් අයගේ ඉඩම යන මායිම් තුළ එකී අංක 311 දරන සැලැස්ම අනුව පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-331/1

---

**සෙලාන් බැංකුව පී.එල්.සී. - ජාඇල ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0270-749206-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.17 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් දෙකම සහතික කරන ලද 2002 නොවැම්බර් 15 වැනි දිනැති අංක 835 සහ 2004 දෙසැම්බර් මස 30 දිනැති අංක 1367 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම ජාඇල පදිංචි පත්තිනිකුට්ටිගේ ජෝසප් ලෙනාඩ් නෝනිස් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි හාරලක්ෂ හාරදහස් හයසිය විසිනවයයි ශත හතක (රු. 1,04,04,629.07) මුදලක් 2008 ජුනි මස 16 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,04,04,629.07 මුදල ද, 2008 ජුනි මස 17 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 835 සහ 1367 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල නගර සභා සීමාව තුළ කණුවන පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 1998.04.04 දිනැති අංක 461 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මීගමුව පාර වරිපනම් අංක 74 දරන මකුල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 සහ කාතමුතු සේරවායිගේ ඉඩම ද, නැගෙනහිරට : පී. ජේ. නෝනිස්ගේ ඉඩම ද, දකුණට : පී. ජේ. නෝනිස්ගේ ඉඩම ද සහ බස්නාහිරට : මීගමුව පාර යන මායිම් තුළ පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එච් 47/219, එච් 47/251 සහ එච් 47/239හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-331/2

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0220-239341-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.09.20 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. තෙපුලන්ගොඩ විසින් සහතික කරන ලද 2005 ඔක්තෝබර් 07 වැනි දිනැති අංක 847 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොටුවිල පදිංචි දොඩම්පගේ චන්ද්‍රානි ඥාණලතා ජයවර්ධන සහ ප්‍රේමදාස හේවාවිතාරණ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තිස්හතරලක්ෂ අනූහතර දහස් එකසිය පනස් එකයි ශත තිස් නවයක් (රු. 34,94,151.39) මුදලක් 2006 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 34,94,151.39 මුදල ද, 2007 ජනවාරි මස 01 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 847 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දකුණු අළුත්කුරු කෝරළේ, කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ අඹතලෙන් පහළ කොටුවිල පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 1996 අප්‍රේල් මස 25 දිනැති අංක 3760 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෝගහවත්ත නමැති ඉඩමේ ලොට් ඒ ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කොඩිකාරගේ ඉඩම ද, නැගෙනහිරට : පෙර කී අංක 3760 දරන සැලැස්මේ සඳහන් මෙම ඉඩමේ බී කැබැල්ල ද, දකුණට : අඹතලේ ප්‍රධාන පාර සහ බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පෙර කී අංක 3760 දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම එකයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.12) නොහොත් හෙක්ටයාර් 0.0155 විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය

කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 793/47 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-331/3

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - කෑගල්ල ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0100-01322917-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.31 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. අයි. ගම්ලත් විසින් සහතික කරන ලද 2005 අගෝස්තු 25 වැනි දිනැති අංක 1001 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දේවාලේගම පදිංචි සුබසිංහ පතිරනගේ නිශාන්ත රොහාන් ජයසේකර යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් හත්සිය පහක් (රු. 3,62,705) මුදලක් 2008 ජුනි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 3,62,705 මුදල ද, 2008 ජුලි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1001 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඕතොට කෝරළේ, දඹදෙනි හත්පත්තුවේ, ගල්බොඩගම ලින්දර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් සාදන ලද 2004.10.06 දිනැති අංක 1706 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහහේනේවත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (අංක 1706 දරන සැලැස්මේ සඳහන් ලොට් 1) ද, නැගෙනහිරට : අංක 1706 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ද, දකුණට සහ බස්නාහිරට : එම්. පී. සිරිල්ට අයිති ඉඩම ද, යන මායිම් තුළ පර්චස් විසි හතරයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 24.7) නොහොත් 0.0624ක් විශාල එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

පෙර කී ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ බෙදන ලද කොටසකි :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඕතොට කෝරළේ, දඹදෙනි හත්පත්තුවේ, ගල්බොඩගම ලින්දර ගමේ පිහිටි මහහේනේවත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : බණ්ඩියාගේ හේවතේ වත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේ 3/5න් ඉතිරි කොටසට ද, දකුණට : පැලඉණි වැට සහ මෙම ඉඩමේ ඉතිරි කොටස සහ බස්නාහිරට : උන්ගාට අයිති ඇහැලගහේ හේනේ ඉඩම යන මායිම් තුළ කුරහන් ලාස් එක හමාරක වපසරිය සහ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව 449/259හි ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන පරිදි මාර්ග අයිතිය සමග :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඕතොට කෝරළේ, දඹදෙනි හත්පත්තුවේ, ගල්බොඩගම ලින්දර ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. නන්දසේන විසින් සාදන ලද 2004.10.06 දිනැති අංක 1706 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මහහේනේවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ලොට් 2 සහ 3 ද, දකුණට : ලොට් 4 සහ බස්නාහිරට : පැල ඉණි වැට, යන මායිම් තුළ පර්චස් එකොලහයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 11.7) නොහොත් 0.0296ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එෆ් 1276/14, 15 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-331/4

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - අනුරාධපුර ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0210-01224508-101.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.03 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර

ඇත) ප්‍රසිද්ධ නොතාරිස් කේ. කේ. ඩබ්ලිව්. චාමරසිංහ විසින් සහතික කරන ලද 2005 මාර්තු 15 වැනි දිනැති අංක 577 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම අනුරාධපුරය පදිංචි මීගෙල් පෙරේරා මහවිදානගේ ලක්ෂ්මන් තුසිත යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන්ලක්ෂ හතලිස්හයදහස් දෙසිය හැත්තෑඑකයි ශත අනූහයක් (රු. 3,46,271.96) මුදලක් 2008 මාර්තු මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 3,46,271.96 මුදල ද, 2008 අප්‍රේල් මස 01 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 577 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත නැගෙනහිර කන්දර කෝරළේ, අනුරාධපුර නගර සභා සීමාව තුළ නව නගරය අදියර II හි පිහිටි දැන් කඩ 50 වරිපනම් අංක 422/(සාප්පු අංක 13) දරන 1997.06.06 දිනැති බලයලත් මිනින්දෝරු ඩී. එම්. පී. දිසානායක විසින් සාදන ලද අංක 2686 දරන සැලැස්මේ ලොට් 01 ලෙස දැන් වෙන් කර ඇති මිණුම්පති විසින් සාදන ලද එප්. යූ. පී. ඒ. 3හි සඳහන් ලොට් අංක 2443 ලෙස පෙන්නුම් කරනු ලබන වන්නියන්කුලම මූකලාන නමැති වෙන්කළ කොටස සහ ඉඩම් කොටසට මායිම්, උතුරට : එප්. යූ. පී. ඒ 3හි සඳහන් ලොට් 2464 1/3 ද, නැගෙනහිරට : එප්. යූ. පී. ඒ3හි සඳහන් ලොට් 2444 (සාප්පු අංක 14) ද, දකුණට : එප්. යූ. පී. ඒ3හි සඳහන් ලොට් 2464 3/3 සහ බස්නාහිරට : එප්. යූ. පී. ඒ 3හි සඳහන් ලොට් 2442 සහ 2464 3/3 (සාප්පු අංක 12) ද යන මායිම් තුළ පර්චස් තුනයි දශම එකයි හයක් (අ. 0, රූ. 0, පර්. 3.16) නොහොත් (හෙක්ටයාර් 0.0080) විශාල, වරිපනම් අංක 422 දරන ගොඩනැගිල්ල (සාප්පු අංක 13) සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඒ 369/36 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

06-331/5

---

### සෙලාන් බැංකුව පී.එල්.සී - ගල්කිස්ස ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0030-171088-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.31 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඒ. එමැනුවෙල් විසින් සහතික කරන ලද 1996.01.22 වැනි දිනැති අංක 950 සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1998.11.13 දිනැති අංක 1302 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම රත්මලාන ලියාපදිංචි අංක ඩබ්ලිව් 57072 දරන සී ඇන්ඩ් වයි ඇසෝෂියේට්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ සියල්ලෝම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන රෝහිත් යුවරාමා තිරිමාවිතාන සහ නවරත්න අබේසුන්දරලාගේ චන්ද්‍රිකා කල්යානි තිරිමාවිතාන යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑතුන්දහස් තුන්සිය විසිතුනයි ශත හැත්තෑහතක (රු. 1,7,33,23.77) මුදලක් 2008 ජූලි මස 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 17,33,23.77 මුදල ද, 2008 ජූලි මස 29 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 950 සහ 1032 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මොරටුව නගර සභා සීමාව තුළ කල්දෙමුල්ල වෝඩ් අංක 1 කල්දෙමුල්ල දහම් මාවතට ඔබ්බෙන් ලක්ෂපතිය පිහිටි බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් සාදන ලද 1991 දෙසැම්බර් මස 03 දිනැති අංක 1868 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොවිලවත්ත නමැති ඉඩමේ ලොට් බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, ඊසානට : පී. පී. කො. 4108හි ලොට් 31 ද, ගිණිකොණට : එකී අංක පී. පී. කො. 4108හි ලොට් 33 ද, නිරිතට : මෙහි සඳහන් ලොට් ඒ සහ සී සහ වයඹට : පී. පී. කො. 4108හි ලොට් 35 ද, යන මායිම් තුළ එකී අංක 1868 දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.54) විශාල සියලුම ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය දෙල්කන්ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1343/267 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී අංක කො. 4108 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මාර්ගය සඳහා වෙන් කිරීම් සහ මිණුම්පති විසින් ද වලංගු කරන ලද 1972 සැප්තැම්බර් මස 14 දිනැති අංක 1129 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 4 සහ පෙර කී මිණුම්පති විසින් ද වලංගු කරන ලද අංක 1868 දරන සැලැස්මේ ලොට් සී ලකුණු කළ (මිණුම්පති විසින් වලංගු කරන ලද 1976 ජනවාරි 28 දිනැති අංක 4108 දරන මූලික සැලැස්මේ ලොට් 34 ලෙස පෙන්නුම් කරනු ලබන ඉඩමේ අතුරු බෙදීමක් වන) මාර්ගය සඳහා වෙන් කිරීම උඩින් මාර්ග අයිතිය සහ වෙනත් සමාන

අයිතීන් සමග. මෙය දෙල්කන්ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 1343/268 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

06-331/6

---

**සෙලාන් බැංකුව පී.එල්.සී - බොරැල්ල ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 0820-01640872-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.04 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. ඉදිගහවෙල විසින් සහතික කරන ලද 2005 අගෝස්තු මස 24 වැනි දිනැති අංක 11 සහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. හිරිමුතුගොඩ විසින් සහතික කරන ලද 2006 දෙසැම්බර් මස 15 දිනැති අංක 298 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම රාජගිරියෙහි ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 6259 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මෙසස් වයි. සී. සී. එක්ස්පෝර්ටර්ස් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි දහනවලක්ෂ හාරදහස් හාරසිය අසූනවයයි ශත එකක (රු. 1,01,94,489.01) මුදලක් 2008 ජූලි මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,01,94,489.01 මුදල ද, 2008 ජූලි මස 31 සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 11 සහ 298 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ වැලිකඩ ඔබේසේකර ටවුන් පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986 ඔක්තෝබර් මස 04 දිනැති අංක 2705 දරන සැලැස්මේ දැක්වෙන දංවැටියමුල්ලේකුඹුර හෙවත් සදිලින්නගේකුඹුර හෙවත් අගලමුල්ලකුඹුර නමැති ගොඩනැගිලි, ගස්, වගා බිම සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ ලොට් 7ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : රජයේ ඉඩම සහ අංක 410ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 9 ද, දකුණට : අංක 410ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 8 සහ 30 (පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : අංක 410ඒ දරන සැලැස්මේ සඳහන් ලොට් 5, 6 සහ 30 (පාර සඳහා වෙන්කිරීම) යන මායිම තුළ එකී අංක 2705 දරන සැලැස්ම අනුව පර්චස් විසිතුනයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 23.20) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව එම් 2883/99, 222හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි-නීති.

06-329

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ෆොරිං කරන්සි බැන්කිං යුනිට් ශාඛාව**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 9911-089538-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.16 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එස්. කේ. විජේරත්න විසින් දෙකම සහතික කරන ලද 2007 ජූලි 12 දිනැති අංක 1461 සහ 1464 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙහිවල සංස්ථාපිත කිරීමේ සහතික අංක එන් (පීවීඑස්) 9569 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඇක්ටිව්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දෙහිවල පදිංචි අබ්දුල් අසීස් මොහමඩ් ෂිඩ්නි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ ඇමෙරිකානු ඩොලර් එක් ලක්ෂ අනූ තුන් දහස් හාරසිය විසි දෙකයි ශත හැත්තෑ හතක (ඇ.ඩො. 1,93,422.77) මුදලක්, 2008 ඔක්තෝබර් මස 31 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී ඇ. ඩො. 1,93,422.77 මුදල ද, 2008 නොවැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට නවය (9%) බැගින්

වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1461 සහ 1464 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් පළමුවෙනි සහ දෙවෙනි උපලේඛනවල විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය සභා සීමාව තුළ මාතලේ දකුණ ගම්පහ සිය පත්තුවේ ගල්වඩු කුඹුර දඹුල්ල පාර දිගේ පිහිටි මිනුම්පති විසින් සාදන ලද 1992 සැප්තැම්බර් මස 01 දිනැති අංක 1062 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඔලිස්කොම්බේ වත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩමේ ලොට් 1 ලකුණු කළ දඹුල්ල පාර, වරිපනම් අංක 128 දරන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 393 දරන මූලික සැලැස්මේ සඳහන් ලොට් 7 ද, නැගෙනහිරට : මාතලේ දඹුල්ල මහා මාර්ගය ද, දකුණට : ප්‍රාදේශීය සභා පාර සහ බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර සහ අංක 393 දරන මූලික සැලැස්මේ සඳහන් ලොට් 12 ද, යන මායිම් තුළ එකී අංක 1062 දරන සැලැස්ම අනුව අක්කර දෙකයි, රූඩ් දෙකක් (අක්කර 2, රූඩ් 2, පර්චස් 0) නොහොත් (හෙක්ටයාර් 1.012) විශාල, ඉඩම. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 423/176 යටතේ (සහ බී510/22) හි ද ලියාපදිංචි කර ඇත.

### දෙවෙනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, (ගල්කිස්ස ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ ගල්වල වෝඩ් අංක 7 හි පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලලුදීන් විසින් සාදන ලද 1990 දෙසැම්බර් මස 14 දිනැති අංක 2015 බී දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ගොරකගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩමේ ලොට් ඒ 3 ලකුණු කළ වරිපනම් අංක 46බී දරන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කොටගම වාචිස්සර මාවත ද, නැගෙනහිරට : ලොට් ඒ 4 ද, දකුණට : පිංවත්ත පාර වරිපනම් අංක 3/1 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : ලොට් ඒ 2 ද යන මායිම් තුළ එකී අංක 2015බී දරන සැලැස්ම අනුව පර්චස් එකොළහයි දශම අටයි බිංදුවක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 11.80) විශාල ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් 1707/233 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

06-348

## සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.31 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ප. එස්. එම්. ගුණසිංහ විසින් දෙකම සහතික කරන ලද 2006 සැප්තැම්බර් මස 04 දිනැති අංක 1835 සහ 2006 මාර්තු මස 27 දිනැති අංක 1954 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මීගමුව ව්‍යාපාර ලියාපදිංචි සහතික අංක ඩබ්ලිව්/වී 1287 යටතේ මානෙල්කා ඩිස්ට්‍රිබියුටර්ස් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ දෙදෙනාම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලොකුබාලසූරිය අප්පුහාමිලාගේ නන්දසේන බණ්ඩාර සහ පනම්බරගේ මේරි හයසින්ත් ලක්ෂිකා ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් අසූදෙලක්ෂ හැටතුන්දහස් අටසිය දහඅටයි ශත පහක (රු. 82,63,818.05) මුදලක්, 2008 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 82,63,818.05 මුදල ද, 2008 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් පහ (35%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1835 සහ 1954 දරන බැඳුම්කර සමගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ සහ මහ නගර සභාව තුළ තම්මිට දෙවැනි කොට්ඨාසයේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සාදන ලද 1997.12.31 දිනැති අංක 2440ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෙලිගහවත්ත හෙවත් සියඹලාගහවත්ත නමැති ශාන්ත ජෝශප් වීදියේ වරිපනම් අංක 203 දරන ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කැමිලස් රුද්‍රිගු ගේ ඉඩම ද, නැගෙනහිරට: ලංකා පෙන්තකොස්ටල් මිසමේ පරිශ්‍රය ද, දකුණට : ශාන්ත ජෝසප් වීදිය ද සහ බස්නාහිරට : නෙලී ප්‍රනාන්දුගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් විසිහතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 27.5) විශාල, ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 220/295 හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කර ඇති ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි :

පෙර කී තම්මිට දෙවැනි කොට්ඨාසයේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද 1986.11.25 දිනැති අංක 2178 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බෙලිගහවත්ත හෙවත් සියඹලාගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට කැමිලස් රුදිගු ගේ සහ ඒ. ජයකොඩිගේ ඉඩම ද, නැගෙනහිරට : ලංකා පෙන්තකොස්ටල් මීසමේ පරිශ්‍රය ද, දකුණට : ශාන්ත ජෝසප් වීදිය ද සහ බස්නාහිරට : ඩබ්ලිව්. එෆ්. ප්‍රනාන්දුගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් විසිඅටක් (අ. 0, රූ. 0, පර්. 28) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 220/255 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

06-330/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවට් බෑන්කිං යුනිට් ශාඛාව**
(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 9957-00330667-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.03.31 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. ඉදිගහවෙල විසින් සහතික කරන ලද 2005.08.31 දිනැති අංක 14 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි විමලේන්ද්‍රන් රගවාන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් නව කෝටි විසිපන්ලක්ෂ අසූහත්දහස් පන්සිය හැට නවයයි ශත දහහතරක (රු. 9,25,87.569.14) මුදලක්, 2007 නොවැම්බර් මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 9,25,87,569.14 මුදල ද, 2007 නොවැම්බර් මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 14 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමුවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කොළඹ මහ නගර සභා සීමාව තුළ බොරැල්ල, ගෝතමී පාර පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ජේ. පීරිස් විසින් සාදන ලද 2004 ජූලි මස 06 දිනැති අංක 6081 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අගලබොඩකුඹුර කුඹුර නමැති, ගස්, වගා බිම සහ එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ දැන් ගෝතමී පටුමග, වරිපනම් අංක 61 දරන ලොට් 28 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස මායිම්, උතුරට : ලොට් 27 ද, නැගෙනහිරට: ලොට් 30 (අඩි 3යි අඟල් 3ක් පළල කාණුව) ද, දකුණට : ලොට් 29 (අඩි 6ක් පළල කාණුව) සහ බස්නාහිරට : ලොට් 29 (අඩි 6ක් පළල කාණුව) යන මායිම් තුළ එකී අංක 6081 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.75) විශාල ඉඩම.

එකී අංක 6081 දරන සැලැස්මේ සඳහන් ලොට් 28 පහත සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ :

පෙර කී, බොරැල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එච්. බී. ජෝසප් විසින් සාදන ලද 1992 ජනවාරි මස 26 වැනි දිනැති අංක 91/40ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අගලබොඩකුඹුර කුඹුර නමැති, ගස්, වගා, බිම සහ එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ දැන් ගෝතමී පටුමග වරිපනම් අංක 61 දරන ලොට් 28 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 27 ද, නැගෙනහිරට : ලොට් 30 ද, දකුණට: ලොට් 29 සහ බස්නාහිරට : ලොට් 29 සහ 22 ද යන මායිම් තුළ එකී අංක 91/40ඒ දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 9.75) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 975/101 හි ලියාපදිංචි කර ඇත.

**දෙවැනි උපලේඛනය**

පෙර කී, බොරැල්ල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එච්. බී. ජෝසප් විසින් සාදන ලද 1992 ජනවාරි මස 26 වැනි දිනැති අංක 91/40ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන අගලබොඩකුඹුර කුඹුර නමැති, ඉඩමේ ලොට් 29 ලකුණු කළ (කාණුව) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට්ස් 1, 7, 8, 19, 20, 22, 27, 28 සහ 30 ද, නැගෙනහිරට: ලොට්ස් 28 සහ 31 ද, දකුණට : පී. පී. කො. 5478 හි සඳහන් ලොට් 1 ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයිති දේපළ සහ බස්නාහිරට : එච්. ඩී. සිරිල් සහ තවත් අය හිමිකම් කියනු ලබන දේපළ සහ ලොට්ස් 1, 7, 8, සහ 20 ද යන මායිම් තුළ එකී අංක 91/40ඒ දරන සැලැස්ම අනුව පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 10.50) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 975/102හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

06-328

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 11 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ෂාමිලා තිලිණී විජේරත්න විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 152 සහ 2005 අප්‍රේල් මස 19 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් (මෙහි මින් මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) දේවාලපොල, ගනිහිමුල්ල, අංක 9/20 දරන ස්ථානයේ පදිංචි අත්තනායක මුදියන්සේලාගේ තිලකරත්න යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය (කලින් කොළඹ 01, යෝක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තවද, ඉහත සඳහන් උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව 2008.12.09 දිනට රුපියල් දහතුන්ලක්ෂ පනස්අටදහස් හාරසියයකුත් ශත තිස්හයක මුදලක් (රු. 13,58,400.36) වර්තමානයේ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද, ඉහත කී රුපියල් දහතුන්ලක්ෂ පනස්අටදහස් හාරසියයකුත් ශත තිස්හයක මුදලක් (රු. 13,58,400.36) සහ නිවාස ණය මත හිඟ මුදල වන රුපියල් දොළොස්ලක්ෂ පනස්එක්දහස් තුන්සිය අසූඅටකුත් ශත හතලිස්අටක මුදල මත (රුපියල් 12,51,388.48) 2008.12.10 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 24% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වේනොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියැඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, ගනිහිමුල්ල ගමේ පිහිටි "පොල්හේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් විසින් මැන සාදන ලද අංක 901B සහ 1997 පෙබරවාරි මස 13 වැනි දිනැති පිඹුරු ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 2 නමැති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 16 ද, නැගෙනහිරට : ලොට් 1 ද, දකුණට : ලොට් 13 සහ 12 ද, බස්නාහිරට : ලොට් 3 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 901B දරන පිඹුර අනුව පර්චස් පහළොවකුත් දශම එකයි බිංදුවක (අ. 0, රූ. 0. පර්. 15.10) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A269/148 දරන වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ඊට ඉහත සඳහන් අංක 901B දරන පිඹුරේ ලොට් 16 සහ 17 දරන බිම් කැබලි මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06-436/2

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 140015065.
ණය ගිණුම් අංකය : 181054, 193648, 234207, 289013.

2008 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දා වූ ද, 2007 සැප්තැම්බර් මස 27 වැනි දින හා අංක 3005 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද. පැහැර හැර ඇති හෙයින්, (මෙහි 1 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද, ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2003 දෙසැම්බර් මස 21 වැනි හා අංක 1291 ද, 2004 ජූනි මස 17 වැනි දින හා අංක 1476 ද, 2005 නොවැම්බර් මස 22 වැනි දින හා අංක 2087 ද, සහ 2006 මාර්තු මස 12 වැනි දින හා අංක 2243 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් (මෙහි 2 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද,

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි නමට ලියන ලද්දා වූ ද, 2002 නොවැම්බර් මස 29 වැනි දින හා අංක 1037 ද, සහ 2006 මැයි මස 21 වැනි දින හා අංක 2339 ද, දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 3 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද,

එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2002 නොවැම්බර් මස 29 වැනි දින හා අංක 1036 ද, 2005 අප්‍රේල් මස 05 වැනි දින හා අංක 1784 ද, සහ 2006 මාර්තු මස 12 වැනි දින හා අංක 2242 ද යන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/ උකස්කරුවන් හැටියට ද පැහැර හැර ඇති හෙයින් (මෙහි 4 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද,

එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද, 2002 නොවැම්බර් මස 29 වැනි දින හා අංක 1035 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 5 වැනි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) ද,

එසේම ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එස්. විජේසේකර විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද, 2006 මැයි මස 24 වැනි දින හා අංක 2344 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හික්කඩුව විදානරාලලාගේ දමිතා රුවන්ගනී සහ කාරියවසම් කටුකෝලිහ ගමගේ බන්දුල පද්මසිරි ණයකරුවන්/උකස්කරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් (මෙහි 5 වැනි සහ 6 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කරන ලද ඉඩම්) ද,

ඉහත බැඳුම්කර යටතේ රුපියල් විසි මිලියන පන්සිය තිස්හත් දහස් පනස් හතයි ශත හැත්තෑ එකක (රු. 2,05,37,057.71) මුදලක් 2008 ජූලි මස 03 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතු සහ ලැබිය යුතුව ඇති හෙයින්, එකී රුපියල් විසි මිලියන පන්සිය තිස්හත් දහස් පනස් හතයි ශත හැත්තෑ එකක (රු. 2,05,37,057.71) මුදලට 2008 ජූලි මස 04 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 92,14,002.92ක මුදල මත 33%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, රු. 89,01,231.08 ක මුදල මත 15%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, සහ රු. 17,99,400 ක මුදල මත 6%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 3005, 1291, 1476, 2087, 2243, 1037, 2339, 1036, 1784, 2242, 1035 සහ 2344 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ ද, අංක 1, 2, 3, 4, 5 සහ 6 දරන උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද, දේපළ සහ පරිශ්‍රයන්, කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### පළමු උපලේඛනය

(බලයලත් මානක ටී. ජී. උපසේන විසින් 2004 පෙබරවාරි මස 13 වැනි දින සාදන ලද අංක 316ඒ දරන පිඹුර පරිදි ලොට් 1 වශයෙන් වෙන් කරන ලද කොටසේ නැවත බෙදීමක් වන) බලයලත් මානක ටී. ජී. උපසේන විසින් 2004 මාර්තු මස 10 වැනි දින සාදන ලද අංක 316බී දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතරේ සහ ගාල්ල මහ නගර සභා සීමාව තුළ හිරිඹුර පිහිටි කයිලගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 3 දරන කොටසට මායිම්, උතුරට : හිරිඹුර පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 ද, දකුණට : එම ඉඩමේ ලොට් 7 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 13 ද යන මායිම් තුළ පර්චස් දහයයි දශම හතරයි නවයක් (අ. 0, රූ. 0, පර්. 10.49) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 662/71 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

### දෙවන උපලේඛනය

බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. ද සිල්වා විසින් 1992 අප්‍රේල් මස 16 සහ 21 වැනි දිනයන් හි සාදන ලද අංක 3950 දරන බෙදුම් පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව පිහිටි ඔරුතොට පැලකැටියෙවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක පී/9258 දරන බෙදුම් නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 5 දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 4 ද, නැගෙනහිරට : ගාල්ල-කොළඹ මහා මාර්ගය ද, දකුණට : මුදිල්ලගහවත්ත (නගර සභා නිවාස) ද සහ බස්නාහිරට : මුහුදු වෙරළ ද යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම අටයි අටක් (අ. 0, රූ. 0, පර්. 13.88) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 734/278 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

### තුන්වන උපලේඛනය

බලයලත් මානක එච්. බී. ගුණවර්ධන විසින් 1946 ජනවාරි මස 12 වැනි දින සාදන ලද අංක 2102B දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව පිහිටි මාදන්ගහවත්ත හෙවත් දංගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියලුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක 39018 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 7 දරන කොටසට මායිම්, උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 4 ද, දකුණට : එම ඉඩමේ ලොට් 6 ද සහ බස්නාහිරට : ලොට් 13 වශයෙන් ලකුණු කොට ඇති කරත්ත පාර ද යන මායිම් රූඩ් එකයි පර්චස් හතරක් (අ. 0, රූ. 1, පර්. 4) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 767/04 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

### හතරවන උපලේඛනය

1. බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. ද සිල්වා විසින් 1964 දෙසැම්බර් මස 30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියලු දේත් සමඟ කහටගහවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 10 දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 17 (වඩාත් නිවැරදිව එම ඉඩමේ ලොට් 17 සහ 11) ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 9 ද, දකුණට : එම ඉඩමේ (අඩි 6 1/2ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 25 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 11 ද යන මායිම් පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 766/216 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

මෑතක දී සිදුකරන ලද මිනුම අනුව එකී දේපළ මෙසේ විස්තර කර ඇත.

එකී හික්කඩුවේ, වැවල පිහිටි බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) 1964.12.30 වැනි දින සාදන ලද අංක 409 දරන පිඹුරේ පෙන්වා ඇති කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුර පරිදි එකී හික්කඩුවේ වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ පිහිටි

ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලුදේත් සමග කහටගහවත්ත ඉඩමේ බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 10 දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 17 (වඩාත් නිවැරදිව එම ඉඩමේ ලොට් 17 සහ 11) ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 9 ද, දකුණට : එම ඉඩමේ (අඩි 6 1/2ක් පළල පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 25 ද සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 11 ද යන මායිම් පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම.

2. එකී හික්කඩුවේ, වැවල පිහිටි බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964 දෙසැම්බර් මස 30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුර පරිදි ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති කහටගහවත්ත ඉඩමේ පිහිටි ගොඩනැගිලි ගසකොළ, වගාවන්, සහ සියළු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 16 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 10 ද, දකුණට : එම ඉඩමේ (අඩි 6 1/2ක් පළල පාර සඳහා වෙන් කරන ලද) ලොට් 25 ද, (වඩාත් නිවැරදිව එම ඉඩමේ ලොට් 10 සහ 25) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 12 ද යන මායිම් තුල පර්චස් හයයි දශම දෙකයි අටක් (අ. 0. රූ. 0, පර්. 6.28) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 766/217 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

මෑතකදී සිදුකරන ලද මිනුම අනුව එකී දේපළ මෙසේ විස්තර කරන ලදී.

එකී හික්කඩුවේ, වැවල පිහිටි බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964.12.30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 02 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුරේ පෙන්වා ඇති කහටගහවත්ත කියන ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුරේ පෙන්වා ඇති ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති එකී හික්කඩුවේ වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 11 දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් 16 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 10 ද, දකුණට : (අඩි 6 1/2 ක් පළල පාරක් සඳහා වෙන් කොට ඇති ) එම ඉඩමේ ලොට් 25 ද (වඩාත් නිවැරදිව එම ඉඩමේ ලොට් 25 සහ 10) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 12 ද යන මායිම් පර්චස් හතයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 7.5) විශාල ඉඩම.

3. බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964 දෙසැම්බර් මස 30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 17 දරන ඉඩමට මායිම්, උතුරට : එම ඉඩමේ (අඩි පාරක් වන) ලොට් 24 සහ එම ඉඩමේ (පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 26 ද, නැගෙනහිරට : එම ඉඩමේ (පාරක් සඳහා වෙන් කොට ඇති) ලොට් 26 ද, (වඩාත් නිවැරදිව අඩි 25 ක් පළල පාරක් සඳහා වෙන්කොට ඇති) එම ඉඩමේ ලොට් 7 සහ ලොට් 8 ද, දකුණට : එම ඉඩමේ ලොට් 7, 8, 9 සහ 10 ද (වඩාත් නිවැරදිව එම ඉඩමේ ලොට් 7, 9 සහ 10) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 16 ද යන මායිම් තුළ පර්චස් තිස් හතරයි දශම තුනයි තුනක් (අ. 0. රූ. 0. පර්. 34.33) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 767/224 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

මෑතකදී සිදුකරන ලද මිනුම අනුව එකී දේපළ මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964.12.30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුරේ පෙන්වා ඇති එකී හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුර පරිදි එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 17 දරන කොටසට මායිම්, උතුරට : එම ඉඩමේ ලොට් (අඩි පාරක් වන ) ලොට් 24 සහ එම ඉඩමේ (පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 26 ද, නැගෙනහිරට : එම ඉඩමේ (පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 26 (වඩාත් නිවැරදිව එම ඉඩමේ අඩි 25ක් පළල පාරක් සඳහා වෙන්කොට ඇති) ලොට් 26 ද, එම ඉඩමේ 7 සහ 8 ද, දකුණට : එම ඉඩමේ ලොට් 7, 8, 9 සහ 10 ද (වඩාත් නිවැරදිව ලොට් 7, 9 සහ 10) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 16 ද, යන මායිම් තුළ පර්චස් තිස් හයක් (අ. 0, රූ. 0, පර්. 36) විශාල ඉඩම.

4. බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964 දෙසැම්බර් මස 30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 18 දරන ඉඩමට මායිම්, උතුරට : ගෙදර වත්ත හෙවත් ගොඩගමගේ වත්ත සහ කරත්ත පාර ද, නැගෙනහිරට : කෝපි වත්ත ද, දකුණට : එම ඉඩමේ (පාරක් සඳහා වෙන් කරන ලද) ලොට් 26 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 19 ද යන මායිම් තුළ පර්චස් හයයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 6.8) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 767/243 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

මෑතක දී සිදුකරන ලද මිනුම පරිදි එකී දේපළ මෙසේ විස්තර කර ඇත.

බලයලත් මානක ඩබ්ලිව්. ඒ. ජී. සිල්වා විසින් 1964.12.30 වැනි දින (වඩාත් නිවැරදිව 1963 නොවැම්බර් මස 16 වැනි දින සහ දෙසැම්බර් මස 2 වැනි දින) සාදන ලද අංක 409 දරන පිඹුරේ පෙන්වා ඇති එකී හික්කඩුව වැවල පිහිටි කහටගහවත්ත ඉඩමේ බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 2002 ජනවාරි මස 18 වැනි දින සාදන ලද අංක 7059 දරන පිඹුර පරිදි එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ගාල්ල දිසා අධිකරණයේ අංක පී/1559 දරන නඩුවේ වාර්තාගත වී ඇති ලොට් 18 දරන කොටසට මායිම්, උතුරට : ගෙදර වත්ත හෙවත් ගොඩගමගේ වත්ත සහ පාර ද, නැගෙනහිරට : කෝපි වත්ත ද, දකුණට : දැනට ගාල්ල-කොළඹ මහ මාර්ගය වන එම ඉඩමේ (පාරක්

සඳහා වෙන්කොට ඇති) ලොට් 26 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 19 ද යන මායිම් තුළ පර්චස් හතක් (අ. 0, රූ. 0, පර්. 7) විශාල ඉඩම.

### පස්වන උපලේඛනය

බලයලත් මානක ජී. ඩී. එස්. කරුණාතිලක විසින් 1964 අප්‍රේල් මස 25 වැනි දින සහ මැයි මස 3 වැනි දින සාදන ලද අංක 239ඒ දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, හික්කඩුව නාරිගම් වැවල පිහිටි කෝන්ගහවත්ත, හෙවත් පැලකැටියෙවත්ත සහ පැලකැටියෙවත්ත හෙවත් ජන්ගෙ අම්මගෙවත්ත කියන (ගාල්ල දිසා අධිකරණයේ අංක පී/2395 දරන නඩුවේ වාර්තාගත වී ඇති) ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියළුදේත් සමග බෙදා වෙන් කරන ලද ඒකාබද්ද සහ යාබද ලොට් 14, 15, 16 සහ 17 දරන ඉඩම් කොටස්වලට මායිම්, උතුරට එම ඉඩමේ ලොට් 18 සහ 33 ද, නැගෙනහිරට : ආචාරිය මලපලාවත්ත ද, දකුණට : ජලන් වත්ත ද සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 13 ද, නිරිතදිගට සහ ඊසානදිගට : එම ඉඩමේ පාරක් සඳහා වෙන්කොට ඇති ලොට් 33 ද යන මායිම් තුළ පර්චස් තිස්හතරයි දශම හතරයි තුනයි හතරක් (අ. 0, රූ. 0, පර්. 34.434) විශාල ඉඩම ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 766/233 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

(බලයලත් මානක ජී. ඩී. එස්. කරුණාතිලක විසින් 1964 අප්‍රේල් මස 25 වැනි දින සහ මැයි මස 3 වැනි දින සාදන ලද අංක 239 ඒ දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් 22 හි) නැවත බෙදීමක් වන බලයලත් මානක ආර්. එස්. වීරසේකර විසින් 2001 ජූනි මස 12 වැනි දින සාදන ලද අංක 840 දරන පිඹුර පරිදි එකී වැවල පිහිටි කෝන්ගහවත්ත හෙවත් පැලකැටියෙවත්ත සහ පැලකැටියෙවත්ත හෙවත් ජන්ගෙ අම්මගෙවත්ත ඉඩමේ ගොඩනැගිලි, ගසකොළ, වගාවන් සහ සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 22 ඒ දරන ඉඩමට මායිම්, උතුරට : පිවිසීමේ මාර්ගය සහ ආචාරියා මලපලාවත්තේ කොටසක් හෙවත් ඇන්ඩවත්ත කියන ඉඩම ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 13 ද, දකුණට : එම ඉඩමේ ලොට් 5 ද, සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 5, 4, 3 සහ 2 ද සහ (ආචාරියාමලපලාවා) ආචාරියාමලපලවා වත්තේ කොටසක් හෙවත් ඇන්ඩවත්ත කියන ඉඩම ද, යන මායිම් තුළ පර්චස් නවයයි දශම හතයි පහයි එකක් (අ. 0. රූ. 0, පර්. 9.751) විශාල ඉඩම වේ.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

06-406

---

### වයඹ සංවර්ධන බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ බලය ලැබී ඇති පරිදි, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී බැංකුවේ අනුප්‍රාප්තික වයඹ සංවර්ධන බැංකුවේ නීතිමය ප්‍රතිපාදන අනුව සම්මත කරන ලද යෝජනා සම්මුතිය.

වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් අයුරු සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය

වයඹ සංවර්ධන බැංකුව නමට ලියන ලද නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් ඇස්. බී. වඳුරාගල මිය විසින් සහතික කරන ලද 2004.07.01 වැනි දින අංක 11755 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කුරුණෑගල දිස්ත්‍රික්කයේ මා එළිය, කු/මා එළියෙහි පදිංචි වර්ණකුලසූරිය ආනන්ද පීරිස් ණයකරු හා උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ වයඹ සංවර්ධන බැංකුවට ලැබිය යුතුව ඇති රුපියල් හතලිස් අටදහස් හාරසීයය (රු. 48,400)ක මුදල ද, එකී මුදල 2008.03.31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුන වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර, එකවර අයකර ගැනීම පිණිස ඉහත අංක 11755 දරන බැඳුම්කරය මගින් වයඹ සංවර්ධන බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව වයඹ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හිරියාල හත්පත්තුවේ දිවිගන්දහය කෝරළයේ අංක 372 මා එළිය දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මා එළිය ගමේ පිහිටි පතහවලයාය නැමැති ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අ. ග. පි. 1961 දරන පිඹුරේ අංක 362 න් 1997.07.31 වැනි දින එම්. ඩබ්. ආරියරත්න අවසරලත් මානක නිලධාරි තැන විසින් මැන සාදන ලද අංක 1088 දරන පිඹුරේ අංක 03 දරන කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම් උතුරට : මරිය මාලනී පීරිස්ගේ වැට (අංක 1088 දරන පිඹුරේ අංක 02 දරන කැබැල්ල) ද, නැගෙනහිරට : ඩබ්. පාවුලු පිරිස් හිමිකම් කියන ඉඩම ද, දකුණට : අඩි පාර ද, බස්නාහිරට : කුරුණෑගල මඩගල්ල ප්‍රධාන පාර ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් තුනයි දශම හතරයි නවය (අක්. 0, රූ. 01, පර්. 3.49) ට විශාල ඉඩම සහ ඊට අයිති සියලු දෙයත් සමග වේ.

මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ L. D. O./B 1720/98 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි,

ඒ. එච්. එම්. එම්. බී. ජයසිංහ,
සහකාර සාමාන්‍යාධිකාරී අයකිරීම්.

වයඹ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
අංක 155, මීගමු පාර,
කුරුණෑගල.

06-380

## ලංකා බැංකුව - වත්තේගම ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.05.05 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වී. අන්දරවැව මිය විසින් සහතික කරන ලද 2007.03.21 වැනි දිනැති අංක 401 දරන උකස්කරය මත මුල් මුදල් හා 2009.03.22 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හැට දෙලක්ෂ හතළිස් හත්දහස් හයසිය පනස් තුනයි ශත පනස් එකක (රු. 62,47,653.51) මුදල සමග රුපියල් හතළිස් නව ලක්ෂ පනස් තුන් දහස් අසූනමයයි ශත හැට හතක (රු. 49,53,089.67) මුදල මත 2009.03.23 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසිනමයක (29%) වාර්ෂික පොළියක් ද වත්තේගම, මහනුවර පාර, අංක 134 දරන ස්ථානයේ පදිංචි ගලේගෙදර ශාන්තකුමාර බණ්ඩාර මයා හා වත්තේගම, කුඩුගල පාර, අංක 91/4 දරන ස්ථානයේ පදිංචි අන්දරමාන්නගේ අරුණ ෂානක අන්දරමාන්න මයා යන අයවලුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන්වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2007.03.21 දිනැති අංක 401 දරන බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට දෙලක්ෂ හතළිස් හත්දහස් හයසිය පනස්තුනයි ශත පනස් එකක (රු. 62,47,653.51) මුදල සමග 2009.03.23 වැනි දින සිට විකිණීම කෙරෙන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරිංටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වැනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර, පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම හි පිහිටි, බලය ලත් මිනින්දෝරු ඒ. දොලොස්වෙල මයා විසින් සාදන ලද 1977.12.09 වැනි දිනැති අංක 2466 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති, "මොරගහමුදුනේ වත්ත" යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන උතුරට : අංක 2452 දරන පිඹුරේ කැබලි "සී" හි කොටස හා බලයලත් මිනින්දෝරු ඒ. දොලොස්වෙල මයා විසින් සාදන ලද අංක 2465 දරන පිඹුරේ කැබලි "බී" ද නැගෙනහිරට : අංක 2465 දරන පිඹුරේ පෙන්වා ඇති එකී ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : මහනුවර සිට මාතලේ ට යන මහ පාර ද, බස්නාහිරට : කුඩුගල සිට එන පාර ද මායිම් වූ පර්චස් විසිහතයි දශම හතයි දශම හතයි හයයි බින්දුවක (අක්. 0, රූ. 0, පර්. 27.760) ප්‍රමාණයෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ පිහිටා ඇති ගොඩනැගිල්ල හා සෑම සියළු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ. 678/229 පිටුවේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. බී. ඒකනායක මයා,
කළමනාකරු.

ලංකා බැංකුව,
වත්තේගම ශාඛාව.

06-409

## ලංකා බැංකුව - මාවනැල්ල ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.12 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා එක්මතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

1. මහජන නොතාරිස් බී. අලුත්වත්ත විසින් සහතික කරන ලද 2003.01.03 දිනැති අංක 2163 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.02.03 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දෙලක්ෂ හැත්තෑදෙදහස් අසූනවයයි ශත දාසයක (රු. 2,72,089.16) ස්ථිර අයිරා සීමාව ඉක්මවා යන රුපියල් අනූඅටදහස් දෙසිය හැත්තෑවයි ශත හැටක (98,270.60) මුදල ඇතුළත් කොට නැත) මුදලක් සමග රුපියල් දෙලක්ෂ විසිපන්දහසක (රු. 2,25,000) මුදලක් මත වසරකට සියයට විසිපහයි දශම පහ (25.5%) බැගින් පොළියක් ද 2009.02.04 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් දේවාලේගම, ඇඳුරාපොත, පිරිවෙන පාරේ හි පදිංචි හපුතැන්නෙ වියන්නලාගේ සංජය නලීන් ධර්මසිරි මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 2163 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහස් අසූනවයයි ශත දාසයක (රු. 2,72,089.16) (ස්ථිර අයිරා සීමාව ඉක්මවා යන රුපියල් අනූඅටදහස් දෙසිය හැත්තෑවයි ශත හැටහයක (රු. 98,270.66) මුදල ඇතුළත් කොට නැත) මුදල සමග 2009.02.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට මාවනැල්ල ලංකා බැංකු ශාඛාවේ ශාඛා කළමනාකරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### උපලේඛනය

1. සබරගමුව පළාතේ, කෑගල්ල මැද පත්තුවේ, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ බටවල පිහිටි කොස්කොළවත්ත නමැති ඉඩමෙහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියළු දේ ද සහිතව බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. එම්. අශෝක විජයකෝන් විසින් සාදන ලද 1999 මාර්තු 15 සහ අප්‍රේල් 12 දිනැති අංක 763 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා නිරූපනය කර මායිම් නිර්ණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 2 උතුරට : බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද අංක 2350 ඒ දරන පිඹුරෙහි ලොට් 3 ද, වඩාත් නිවැරදිව ලොට් 7 ද, ඊසාන දිගට: වඩාත් නිවැරදිව අංක 763 දරන පිඹුරෙහි ලොට් 6 සහ 3 ද ගිනිකොණට: අංක 763 දරන පිඹුරෙහි ලොට් 3 ද, දකුණට : වඩාත් නිවැරදිව නුවර කොළඹ නුවර පාරේ සිට අලුත්නුවර දක්වා වූ මහා මාර්ගය ද, බස්නාහිරට : වඩාත් නිවැරදිව අංක 763 දරන පිඹුරෙහි ලොට් 1 ද, වයඹට : අංක 763 දරන පිඹුරෙහි ලොට් 11 ද සහ බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද අංක 2350 දරන පිඹුරෙහි ලොට් 3 ද, මායිම්ව එකී අංක 763 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයයි දශම දෙකයි හයක (අ. 0, රූ. 0, පර්. 10.26) වපසරියකින් යුක්ත වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 710/207 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී බටවල පිහිටි කොස්කොළවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. එම්.අශෝක විජයකෝන් විසින් සාදන ලද 1999 මාර්තු 15 සහ අප්‍රේල් 12 දිනැති අංක 763 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා නිරූපනය කර මායිම් නිර්ණයකර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 එහි ඇති ගොඩනැගිල්ල සහ අනෙකුත් සියළු දේ ද සහිතව උතුරට : වඩාත් නිවැරදිව බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද අංක 2350 දරන පිඹුරෙහි ලොට් 3 සහ වඩාත් නිවැරදිව ලොට් 8 ද, ඊසාන දිගට : අංක 763 දරන පිඹුරෙහි ලොට් 8 ද, නැගෙනහිරට : වඩාත් නිවැරදිව අංක 763 දරන පිඹුරෙහි ලොට් 6 සහ 13 ද, ගිනිකොණට : අංක 763 දරන පිඹුරෙහි ලොට් 6 සහ 13 ද, දකුණට : වඩාත් නිවැරදිව අංක 763 දරන පිඹුරෙහි ලොට් 2 සහ 3 ද, නිරිතට : අංක 763 දරන පිඹුරෙහි ලොට් 2 සහ 3 ද, බස්නාහිරට : වඩාත් නිවැරදිව බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද අංක 2350 දරන පිඹුරෙහි ලොට් 3 ද, වයඹට : බලයලත් මිනින්දෝරු ටී. එන්. කාදර් විසින් සාදන ලද අංක 2350 දරන පිඹුරෙහි ලොට් 3 ද මායිම් එකී අංක 763 දරන පිඹුර ප්‍රකාර පර්චස් දොළහයි දශම හයයි පහක (අ. 0, රූ. 0, පර්. 12.65) වපසරියකින් යුක්ත වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 710/208 ශීර්ෂයෙහි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. එම්. රත්නායක,
කළමනාකරු.

ලංකා බැංකුව,
මාවනැල්ල ශාඛාව.

06-407

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය - 0200003738.
ණයකරුගේ සම්පූර්ණ නම - පලවෙනි ආරච්චිගේ ලලිත් සිරිචන්ද්‍ර පෙරේරා

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද 24863 හා 2007.04.09 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූලය සංස්ථා(සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූලය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාර ලක්ෂ අනූ දහස් හාරසිය පනස් එකයි ශත හැත්තෑ හතක (රු. 490,451.77) ක මුදලක් වර්ෂ 2009.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

01. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්න කොටස වන රුපියල් ලක්ෂ හතරක (රු. 400,000.00) මුදල ද වර්ෂ 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් අනූ දහස් හාරසිය පනස් එකයි ශත හැත්තෑ හතක(රු. 90,451.77) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාර ලක්ෂ අනූ දහස් හාරසිය පනස් එකයි ශත හැත්තෑ හතක (රු. 490,451.77) ද,

02. එකී රුපියල් ලක්ෂ හතරක (රු. 400,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20% බැගින් වන පොළියක් 2009.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා

03. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධි විධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තුද,

අයකර ගැනීම සඳහා (තදනන්දරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්තා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2009 ක් වූ ජනවාරි මස 27 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රක්කයේ අළුත්කුරු කෝරලේ මැද පත්තුවේ ගම්පහ නගර සභා සීමාවේ අලුත්ගම ග්‍රාමයේ ශ්‍රී බෝධි පාරේ වරිපනම් අංක 371/8 හි පිහිටි වලව්වත්ත නැමැති ඉඩමට 1991.03.14 දින අයි. එම්. සී. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 943 පිඹුර ප්‍රකාර ලොට් 09ට මායිම් උතුරට : ලොට් 18 ද, නැගෙනහිරට : ලොට් 08 ද, දකුණට : ලොට් 10 ද, බටහිරට : පිඹුරු අංක 943 හි ලොට් 19 සහ 13 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හයක (අක්. 0, රූඩ් 0, පර්. 11.6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි හා සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 844/86 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය,

සාමාන්‍යාධිකාරී.

06-416

---

**නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වැනි වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක පීකිව් 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009 පෙබරවාරි මස 11 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුපේක්ෂලී කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද (මෙහි මින් මතු "බැඳුම්කරය" වශයෙන් හඳුන්වනු ලබන) අංක 852 සහ 2007 දෙසැම්බර් මස 27 වැනි දින දරන උකස්බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කඩවත, මහර, එක්සත් මාවතේ, අංක 15 දරන ස්ථානයේ පදිංචි පෝල් ග්ලැඩිසන් ඩැනියෙල් ඇලෙක්සැන්ඩර් යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242, දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.12.09 වැනි දිනට රුපියල් දහසයලක්ෂ විසිනවදහස් පන්සිය හැට හතකුත් ශත අනූහයක මුදලක් (රු. 16,29,567.96) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් දහසය ලක්ෂ විසිනව දහස් පන්සිය හැට හතකුත් ශත අනූහයක මුදල (රු. 16,29,567.96) සහ 2008.12.09 වැනි දිනට නිවාස ණය මත හිඟ මුල් මුදල වශයෙන් රුපියල් දාහතර ලක්ෂ අනූ හතර දහස් නවසිය දහ අටකුත් ශත හැටතුනක මුදල (රු. 14,94,918.63) මත 2008.12.10 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 30% බැගින් තවදුරටත් පොළිය ද ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රයිඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළයේ, රාගම් පත්තුවේ, ජා ඇල, ප්‍රාදේශීය සභාවේ රාගම උපකාර්යාල සීමාව ඇතුළත රාගම, තේවත්ත පාරේ, පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ලක්ෂ්මන් ගුණසේකර විසින් මැන සාදන ලද අංක 568 සහ 1994 නොවැම්බර් මස 23 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 2 නමැති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 හා ලොට් 4 ද, නැගෙනහිරට : ලොට් 4 ද, දකුණට : ලොට් 3 ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 568 දරන පිඹුර අනුව පර්චස් එකොළහකුත් දශම බින්දුවයි තුනක (අ. 0, රූ. 0, පර්. 11.03) හෝ හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි හතයි නවයයි බින්දුවක (හෙක්. 0.02790) විශාලත්වයෙන් යුක්ත බිම් කැබැල්ල සහ ඊට අයිති සෑම සියලු දේත් සමගය. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී593/238 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, ඉහත කී අංක 568 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කළ අඩි 10 ක් පළල ප්‍රවේශ මාර්ගය භාවිත කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

06-381

### ලංකා බැංකුව - මදුරන්කුලිය ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2009.03.12 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් ඊ. එම්. යූ. එම්. කේ. ඒකනායක මහතා විසින් සහතික කරන ලද 2008.06.10 වැනි දිනැති අංක 123 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2009.01.26 වැනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් තිස් එක් ලක්ෂ විසිදහස් හත්සිය අසූ පහයි ශත දාසයක (රු. 31,20,785.16) මුදලක් සමග රුපියල් විසිඅට ලක්ෂ පනස් දහසක (රු. 28,50,000) මුදලක් මත වසරකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද, 2009.01.27 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මදුරන්කුලිය, විරුතෝඩෙයි, රොෂාන් ගාඩ්න් හි අංක 123ඒ හි පදිංචි බදුරුසමාන් මොහොමඩ් රොෂාන් මහතාගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 123 දරන බැඳුම්කරය මත අයවියයුතු ඉහත '1' හි සඳහන් මුදල සමග ඉහත කී දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවියයුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය, පන්නල පාරේ, අංක 56 හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියුස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, පුත්තලම් පත්තු කොට්ඨාසයේ, පුත්තලම්පත්තුව දකුණ, මදුරන්කුලි ග්‍රාමයේ පිහිටි, "ශාන්දි චේනයි" නමැති සහ ඒ ලෙස ප්‍රසිද්ධ ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද 2005 අප්‍රේල් 08 දිනැති අංක ජේ/1495 දරන පිඹුරෙහි ලොට් 03 ලෙස දක්වා නිරූපනය කර මායිම්ව නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3, උතුරට : බලය ලත් මිනින්දෝරු එන්. ක්‍රිෂ්ණසාමි විසින් සාදන ලද අංක 59 දරන පිඹුරෙහි ලොට් අංක 1 ද, නැගෙනහිරට : අංක 59 දරන පිඹුරෙහි ලොට් අංක 1, දකුණට : පාර (ප්‍ර. ස) සහ මොහොමඩ් තව්පික් හා වෙනත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : මොහොමඩ් තව්පික්ගේ ඉඩම සහ ලොට් අංක 2 සහ පාර (මා. සං. අ.) ද, මායිම්ව එකී අංක ජේ/1495 දරන පිඹුර ප්‍රකාර එහි ඇති ගොඩනැගිලි සහ සියළු දේද සහිතව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස්තුනක (අ. 1, රූ. 1, පර්. 33) වපසරියකින් යුක්ත වේ. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී88/156 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ජී. ටී. එච්. එම්. යූ. කුමාරිහාමි,
කළමනාකරු.

ලංකා බැංකුව,
මදුරන්කුලිය.

06-410

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2009.05.22 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006.02.08 වෙනි දිනැති අංක 4521 හා 2006.07.26 වෙනි දිනැති අංක 5075 දරන උකස්කර මත මුල් මුදල් හා 2008.10.21 වෙනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් පනස් පන් ලක්ෂ විසිහය දහස් හාරසිය හැට පහයි ශත හැත්තෑ පහක රු. 55,26,465.75) මුදල සමග රුපියල් පනස් එක් ලක්ෂ හත් දහස් අටසිය අසූ අටයි ශත හැත්තෑ එකක (රු. 51,07,888.71) මුදල මත 2008.10.22 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසි නමයක (29%) වාර්ෂික පොළියක් ද, මහනුවර, මාවිල්මඩ, නාගහඇල්ල පාර, අංක 74/5 දරන ස්ථානයේ පදිංචි බාරත ප්‍රමුක් චන්ද්‍රදාස මයා. හා කන්දේ ගමරාළලාගේ සුමනාවතී චන්ද්‍රදාස මිය. යන අයවළුන්ගෙන් ලංකා බැංකුවට එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2006.02.08 වෙනි දිනැති අංක 4521 හා 2006.07.26 වෙනි දිනැති අංක 5075 දරන උකස්කර මත අයවිය යුතු රුපියල් පනස් පන් ලක්ෂ විසිහය දහස් හාරසිය හැට පහයි ශත හැත්තෑ පහක (රු. 55,26,465.75) මුදල සමග 2008.10.22 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වෙනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම, මහනුවර ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ, මාවිල්මඩ හි පිහිටි, බලයලත් මිනින්දෝරු බර්නාඩ් පී. රූපසිංහ මයා. විසින් සාදන ලද 2002 මැයි මස 19 වෙනි දිනැති අංක 2726 දරන පිඹුරේ කැබලි 3 යනුවෙන් පෙන්නුම් කර ඇති, 2002 ජූනි මස 4 වෙනි දින බෙදන ලද, නාගහඇල්ල පාර වරිපනම් අංක 74/5, 74/5 සී හා 74/6 දරන "ගිරාඹේ වත්ත" යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන ඊශාන දෙසට : වරිපනම් අංක 68/2 දරන ස්ථානය වෙන් කරන කණ්ඩියද (අංක 390 ඒ දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති), ගිණිකොන දෙසට : වරිපනම් අංක 74 දරන ස්ථානය වෙන් කරන රැඳවුම් බැම්ම (අංක 390ඒ දරන පිඹුරේ කැබලි 7ඒ යනුවෙන් පෙන්නුම් කර ඇති) හා නාගහඇල්ල පාරට යන පාර ද, නිරිත දෙසට : නාගහඇල්ල පාරට යන පාර වෙන් කරන රැඳවුම් බැම්ම ද, වයඹ දෙසට : එකී පිඹුරේ කැබලි 1 හා 2 ද මායිම් වූ, පර්චස් තිහයි දශම හතයි බින්දුවක (අක්.0, රූ.0, පර්. 30.70) වපසරියෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල හා එහි තුළ ඇති සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 324/208 හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට, ගන්දහය කෝරළේ, ගුරුදෙනිය හි පිහිටි, බලයලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව මයා. විසින් සාදන ලද 2006.01.16 දිනැති අංක 3555 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "සිංහාරගම හෙවත් මාලිගාතැන්න" යයි හඳුන්වනු ලබන ඉඩමේ කොටසක් වන, උතුරට : රාජනායක ගේ සිංහාරගම හෙවත් මාලිගාතැන්න ඉඩම හා පාර ද , නැගෙනහිරට : රාජනායකගේ සිංහාරගම හෙවත් මාලිගාතැන්න ඉඩම, පාර (මහපාර) කැබලි 2 හා 3 ද, දකුණට : පාර (මහමාර්ග), බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මයාගේ 3455 දරන පිඹුරේ කැබලි 2 හි කොටස, අංක 432 දරන පිඹුරේ කැබලි 2 හි කොටස, අංක 432 දරන පිඹුරේ කැබලි 3 (කෝවිල තිබෙන ස්ථානය) හා කැබලි 2 හා පාර ද (432 දරන පිඹුරේ කැබලි 4) බස්නාහිරට : පාර, රාජනායක ගේ සිංහාරගම හෙවත් මාලිගාතැන්න ඉඩම (අංක 432 දරන පිඹුරේ කැබලි 4) බලය ලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක මයාගේ අංක 3435 දරන පිඹුරේ කැබලි 2හි කොටස ද, මායිම් වූ, අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් තිස්නවයක (අක්. 1 රූ. 2, පර්. 39) වපසරියකින් යුත් බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති සෑම සියලු දේද, ඉහත පිඹුරේ පෙන්වා ඇති පාර, මාර්ග පොදුවේ භාවිතා කිරීමේ අයිතිය හා අනෙකුත් අයිති සමග ද වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 424/186 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

06-411

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2009.05.05 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. අතාවුද මහතා විසින් සහතික කරන ලද 2007.10.04 දිනැති අංක 6018 උකස්කරය මත මුල් මුදල හා 2009.03.13 වෙනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ තිස්නව දහස් හයසිය දහඅටයි ශත විසිපහක (රු. 16,39,618.25) මුදල සමග රුපියල් දහහතර ලක්ෂ පනස් තුන් දහස් දෙසිය හතයි ශත දහතුනක (රු. 14,53,207.13) මුදල මත 2009.03.14 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසි තුනක (23.0%) වාර්ෂික පොළියක් ද අංකුඹුර, පල්ලේගම, සුමිත් ඉදිකිරීම්, අංක 195, දරන ස්ථානයේ පදිංචි ලංකේශ්වර දේවගේ ගම්මැද්ද ගෙදර අනුර හේමන්ත විජේරත්න මයාගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2007.10.04 දිනැති අංක 6018 දරන උකස්කරය මත අයවිය යුතු රුපියල් දහසය ලක්ෂ තිස්නව දහස් හයසිය දහඅටයි ශත

විසිපහක (රු. 16,39.618.25) මුදල සමග 2009.03.14 වෙනි දින සිට විකිණීම කෙරෙන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වෙනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ ද මෙම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම, මහනුවර ලංකා බැංකු අධිශ්‍රේණි ශාඛාවේ කළමනාකරු විසින් ප්‍රසිද්ධ කිරීමට එකී ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුළ (උඩුගම්පොල උප කාර්යාලය) අස්ගිරි වල්පොළ ග්‍රාමයේ පිහිටි, බලය ලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක මයා විසින් සාදන ලද 2003 ඔක්තෝබර් මස 12 වෙනි දිනැති අංක 3888 දරන පිඹුරේ කැබලි 3 යනුවෙන් පෙන්නුම් කර ඇති "ආන්ඩිමුල්ල කුඹුර" (Noe Highland) යයි හඳුන්වනු ලබන, ඉහත කී අංක 3888 දරන පිඹුර අනුව, උතුරට : එම් ඩී. විඩිමන් හා තවත් අයවළුන්ගේ ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 4 ද, දකුණට : අංක 13 දරන කැබැල්ල ද, බස්නාහිරට : කැබලි අංක 2 ද මායිම් වූ, පර්චස් පහළොවක් (අක්. 0, රූ. 0, පර්. 15) ප්‍රමාණයෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය සියල්ල, එහි තුළ ඇති ගස්, වගාවන් හා අනෙකුත් සෑම සියළු දේත් වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 315/244 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. උපතිස්ස බණ්ඩාර මයා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

06-412

---

### ලංකා බැංකුව - වලපනේ ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වගන්තිය යටතේ දැන්වීම

2009.05.05 වෙනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ආතාවුද මහතා විසින් සහතික කරන ලද 2005.10.13 දිනැති අංක 4215 හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වී. අන්දරවැව මිය. විසින් සහතික කරන ලද 2007.12.28 දිනැති අංක 771 දරන උකස්කර මත මුල් මුදල් හා 2009.03.22 වෙනි දින තෙක් පොළිය වශයෙන් රුපියල් හතළිස් ලක්ෂ හතළිස් නව දහස් හයසිය දොළහයි ශත තිස් හතක(රු. 40,49,612.37) මුදල සමග රුපියල් තිස් දෙලක්ෂ අනූ පන් දහසක (රු. 32,95,000) මුදල මත 2009.03.23 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් සියයට විසි නමයක (29%) වාර්ෂික පොළියක් ද වලපනේ, වතුමුල්ල, පල්ලිය පාර හි පදිංචි ගම ගෙදර සරත් විජේවික්‍රම මයාගෙන් ලංකා බැංකුවට අයවිය යුතුව ඇත.

2. ඉහත කී 2005.10.13 දිනැති අංක 4215 හා 2007.12.28 දිනැති අංක 771 දරන බැඳුම්කර මත අයවිය යුතු රුපියල් හතළිස් ලක්ෂ හතළිස් නව දහස් හයසිය දොළහයි ශත තිස් හතක (රු. 40,49,612.37) මුදල මත 2009.03.23 වෙනි දින සිට විකිණීම කෙරෙන දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාර, අංක 24 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 19 වෙනි වගන්තිය හා එහි සංශෝධනයන් යටතේ මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර එළිය දිස්ත්‍රික්කයේ, වලපනේ කොට්ඨාසයේ, ඔය පළාත කෝරළේ, පන්නල ගමේ පිහිටි, "ගෝනමඩිත්ත හේන", යයි හඳුන්වනු ලබන, උතුරට : කේ. පී. උක්කු බණ්ඩාට අයත් කුඹුර ද, නැගෙනහිරට : ටී. එම්. අරුනි කාන්තිගේ හේනේ ඉම ද, දකුණට : රජ මාවත ද, බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස ද මායිම් වූ, පර්චස් විස්සයි දශම දෙකක (අක්. 0, රූ. 0, පර්. 20.02) ප්‍රමාණයෙන් යුත්, බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටිය හා එහි තුළ ඇති සෑම සියළු දේත් වේ. මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඕ. 179/20 පිටුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම අළුතින් මනින ලදුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ කොටසේ උඩපළාත කෝරළේ, පන්නල ග්‍රාමයේ පිහිටි, බලයලත් මිනින්දෝරු ඉන්ද්‍රතිස්ස කොටඹගේ මයා. විසින් සාදන ලද 2005 ජූනි මස 18 වෙනි දිනැති අංක 630/1/2005 දරන පිඹුරේ කැබලි 1 යනුවෙන් පෙන්නුම් කර ඇති "ගෝනමඩිත්ත හේන" යයි හඳුන්වනු ලබන, ඉහත සඳහන් 630/1/2005 දරන මිනුම් හා විවරණය අනුව, උතුරට : කේ. පී. උක්කුබණ්ඩාට අයත් කුඹුර ද, නැගෙනහිරට : එකී පිඹුරේ කැබලි 2 ද, දකුණට : මහ පාර ද, බස්නාහිරට : එකී ඉඩමේ ඉතිරි කොටස ද මායිම් වූ, පර්චස් විස්සයි දශම දෙකක (අක්. 0, රූ. 0, පර්. 20.2) ප්‍රමාණයෙන් යුත් බෙදා වෙන් කරන ලද සියලු ඉඩම් කට්ටිය හා එහි තුළ අති සෑම සියලු දේත් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ජේ. ඒ. පී. එස්. ප්‍රනාන්දු මයා,
කළමනාකරු.

ලංකා බැංකුව.

06-408

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ණය ගිණුම් අංකය : 244680.
ගිණුම් අංකය : 1102003329.

2008 දෙසැම්බර් මස 02 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී :

ගම්පොල ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. සී. සී. ඒකනායක විසින් සහතික කරන ලද 2005 ජුනි මස 23 වැනි දින අංක 1891 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ සමරකෝන් පොඩිආරච්චිගේ උපාලි බණ්ඩාරගේ ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහතුන් ලක්ෂ තිස් එක්දහස් පන්සිය විස්සයි ශත පනස් නවයක (රු. 13,31,520.59) මුදලක් 2008 ජූලි මස 22 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී, එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දහතුන් ලක්ෂ තිස් එක්දාස් පන්සිය විස්සයි ශත පනස් නවයක (රු. 13,31,520.59) මුදල හා 2008 ජූලි මස 23 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 4,30,000ක මුදලක් සඳහා වාර්ෂිකව 22% බැගින් වූ පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අයකර ගැනීම සඳහා එකී අංක 1891 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කර ගනී.

### ඉහත කී උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ගඟපහළ කෝරළේ, රත්මල්කඩුව පිහිටි "සිංහපිටිය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක බී. එම්. එස්. බී. කරුණාරත්න විසින් සාදන ලද 2005.05.04 වැනි දින අංක 5937 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : පාරෙන් ද, උතුරු-නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද හා දකුණු-බස්නාහිරට : ඇලෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගස්, වගාව ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් එකයි (අ. 0, රූ. 1, පර්. 0). මෙය ගම්පොල ඉඩම් කාර්යාලයේ C231/48 වෙළුමේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

06-394

## පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. - බම්බලපිටිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳව දැන්වීම

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2009.04.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී. (මෙය 2009.05.07 වැනි දින සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය මගින් සංශෝධනය කරන ලදි) :

එනම්, නෙට්වර්ක් එක්ස්ප්‍රස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායියා වශයෙන් සහ ඉම්තියාස් රසාක් උකස්කරු වශයෙන් ද කලින් පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. විජේසිංහ විසින් සහතික කරන ලද අංක 525 සහ 2004.09.03 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 2358 සහ 2007.06.07 දිනැති උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් -

(i) 2009.03.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් දහසය ලක්ෂ අසූඅට දහස් පන්සිය අනූ දෙකයි ශත හැට දෙක (රු. 16,88,592.62)ක මුදල සහ 2009.02.28 වැනි දින සිට රුපියල් දහතුන් ලක්ෂ විසිදහස (රු. 13,20,000)ක මුදල මත වර්ෂයකට සියයට දහසය (16%) බැගින් පොළිය ද,

(ii) 2009.03.18 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හැට හතර ලක්ෂ අසූ හතර දහස් තුන්සිය තිස් හයයි ශත නමය (රු. 64,84,336.09) ක මුදල සහ 2009.02.28 වැනි දින සිට රුපියල් හතලිස් නවලක්ෂ අසූඑක් දහස (රු. 49,81,000) ක මුදල මත වර්ෂයකට සියයට විසිනවය (29%) බැගින් පොළිය ද,

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හැඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත් :

එකී අංක 525 සහ 2358 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් අසූඑක් ලක්ෂ හැත්තෑ දෙදහස් නමසිය විසි අටයි ශත හැත්තෑව (රු. 81,72,928.70)ක මුදල සහ 2009.02.28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද ගාස්තු ද අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 9හි එම්. එස්. ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ශ්‍රීයාණි මනම්පේරි වෙත එකී 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරි සහ බලය පවරන ලෙස.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ, පොල්වත්තේ පිහිටි මුහන්දිරම් පාරේ, වරිපනම් අංක 169 දරන බලයලත් මිනින්දෝරු ඩී. එල්. පීරිස් විසින් මැන සාදන ලද අංක 518 සහ 1958 පෙබරවාරි මස 15 දිනැති සැලැස්මේ ලොට් 2 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : නෙල්සන් පටුමගේ අංක 60 දරන පරිශ්‍රය, නැගෙනහිරට : නෙල්සන් පටුමගේ අංක 64 දරන පරිශ්‍රය සහ මුහන්දිරම් පාරේ අංක 171 දරන පරිශ්‍රය, දකුණට : මුහන්දිරම් පාර සහ බස්නාහිරට : මුහන්දිරම් පාරේ වරිපනම් අංක 167 දරන පරිශ්‍රය සහ මායිම් තුළ පිහිටි එකී අංක 518 දරන සැලැස්ම අනුව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම අටයි අට (අ. 0, රූ. 0, පර්. 6.88) ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1048/122හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 2 දරන ඉඩම නැවත මැනුමක් අනුව පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටියේ, පොල්වත්තේ පිහිටි මුහන්දිරම් පාරේ වරිපනම් අංක 169 දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 1537 සහ 1986.11.12 දිනැති සැලැස්මේ ලොට් 2 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති උතුරට : නෙල්සන් පටුමගේ අංක 60 දරන අංක 518 දරන සැලැස්මේ ලොට් 1, නැගෙනහිරට : නෙල්සන් පටුමගේ අංක 64 දරන පරිශ්‍රය සහ මුහන්දිරම් පාරේ අංක 171 දරන පරිශ්‍රය, දකුණට : මුහන්දිරම් පාර සහ බස්නාහිරට : මුහන්දිරම් පාරේ වරිපනම් අංක 167 දරන පරිශ්‍රය යන මායිම් තුළ පිහිටි එකී අංක 1537 දරන සැලැස්ම අනුව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම අටයි අට (අ. 0, රූ. 0, පර්. 6.88)ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

මනෝනීත ආරියනන්ද,
කළමනාකරු - ණය අයකර ගැනීම්.

06-438/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.